# සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලන ක්‍රියාවලියෙහි ජනමාධ්‍ය භූමිකාව

# The Role of the Media in the Contemporary Socio, Economic and Political Process of Society

CENTER FOR MEDIA RESEARCH
SRI PALEE CAMPUS
UNIVERSITY OF COLOMBO

# විද්වත් කතිකාව
# සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලන
# ක්‍රියාවලියෙහි ජනමාධ්‍ය භූමිකාව

# A Critical Discours on

# The Role of the Media
# in the Contemporary Socio, Economic
# and Political Process of Society

**වැඩසටහන් ප්‍රධාන සංවිධානය සහ**
**ප්‍රධාන සංස්කරණය**
ආචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන්

**වැඩසටහන් සහාය සංවිධානය සහ**
**සහය සංස්කරණය**
එන්.ඩබ්.ඩබ්.ජී.කේ.ප්‍රභාශිනී
සජිතා ලක්මාලි හේවාපතිරණ

**ප්‍රකාශනය**
මාධ්‍ය පර්යේෂණ අංශය(CMR)
ශ්‍රී පාලි මණ්ඩපය,
කොළඹ විශ්වවිද්‍යාලය,
හොරණ.

**සංස්කරණය**
© ආචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන්

**සහය සංස්කරණය**
එන්.ඩබ්.ඩබ්.ජී.කේ.ප්‍රභාශිනී
සජිතා ලක්මාලි

**විද්වත් කතිකාව**
සමකාලීන සමාජ ක්‍රියාවලියෙහි ජනමාධ්‍ය භූමිකාව
The Role of the Media
in the Contemporary Socio, Economic and Political Process of Society

**දිනය සහ ස්ථානය**
අරුන්දතී ශාලාව
ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය,
හොරණ.
19/06/2013
සවස 3.00 සිට 6.30 දක්වා

**පරිගණක අක්ෂර සංයෝජනය**
පවිත්‍රා උමයංගනී
අකිල මධුසංඛ බද්දෙවිතාන

**නිර්මාණකරණය සහ පිටු සැලසුම්**
කෝලිත දිසානායක

**මුද්‍රණය සහ ප්‍රකාශනය**
ශ්‍රී පාලි ප්‍රකාශන,
මාධ්‍ය පර්යේෂණ අංශය(CMR),
ශ්‍රී පාලි මණ්ඩපය,
කොළඹ විශ්වවිද්‍යාලය,
හොරණ.
Tel / Fax: 0342261435

# මාධ්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය(CMR)

## සම්බන්ධීකාරක

ආචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන්
අංශාධිපති(වැඩබලන) ප්‍රසංග කලා අධ්‍යනාංශය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

| ලේකම් | උප ලේකම් |
|---|---|
| කේ.වී.එන්.ලක්මාලි | එල්.එච්.වින්දයා දිවුල්වැව |

| භාණ්ඩාගාරික | වෙබ් අඩවි නිර්මාණය |
|---|---|
| එම්.පී.එස්.එම්.ගුණතිලක | කේ.ඩී.එම්.කේ.දිසානායක |
| ඩබ්.ඒ.සිරිවර්ධන | අකිල බද්දෙවිතාන |
| | කේ.එල්.ඩී.ශකිලා |

## පර්යේෂණ සහායක

| | |
|---|---|
| ඩබ්.ඒ.ලක්සිරි නවෝදනී විජේසිංහ | වයි.එම්.සාගරිකා ප්‍රියදර්ශනී |
| දසුනි ජයරත්න | කේ.ඒ.ඩී.මධුෂිකා |
| එම්.ඒ.එස්.එස්.පෙරේරා | එම්.ඩී.ජේ.ටී.කුමාරි |
| සන්දීපනී වීරනායක | අයි.ඒ.චතුෂ්කා ජීවන්ති |
| ආර්.ඩී.සී.නිර්මලා | එරන්ද මහගමගේ |
| මල්කි නිමල්කා රන්මුතුගල | ආර්.ඒ.ඩී.එස්.එස්.රණසිංහ |
| බී.ඒ.එල්.මධුෂාණි | එච්.පී.එස්.රසාංගිකා රන්දිලු ආරිදාස |
| වයි.එම්.දිනුෂිකා යාපා | එස්.වී.එච්.වීරනායක |
| ෆාතිමා ලතීෆ් | කේ.විජේසිංහ |
| කේ.ජයනි චාරුකා ගුණසේකර | දිලිනි සෙව්වන්දි තිලකරත්න |
| ඒ.තිලණි තිලකරත්න | නිලූෂා මධුෂාණි හේමසිංහ |
| පී.එම්.එච්.අබේවික්‍රම | ඩී.ජී.චතුරිකා කුමුදුමාලි |
| ඩී.එච්.රුසිරු නදී | එන්.ඩී.සමන්මලී |

එච්.කේ.රන්සිකා මියුනදී

## වැඩසටහන් මෙහෙයවීම

සම්පත් පතිරාජ, ලක්සිරි විජේසිංහ

# විද්වත් මණ්ඩලය

මහාචාර්ය ටෙනිසන් පෙරේරා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සමාජ විද්‍යා සහ මානව විද්‍යා අධ්‍යයන අංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
නුගේගොඩ.

මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ජනසන්නිවේදන අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

ආචාර්ය ටියුඩර් වීරසිංහ
මණ්ඩපාධිපති,
ශ්‍රී පාලි මණ්ඩපය,
කොළඹ විශ්වවිද්‍යාලය.

ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සමාජ විද්‍යා සහ මානව විද්‍යා අධ්‍යයන අංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
නුගේගොඩ.

ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන
බාහිර කථිකාචාර්ය,
ප්‍රාසාංගික කලා අධ්‍යයන අංශය,
ශ්‍රී පාලි මණ්ඩපය,
කොළඹ විශ්වවිද්‍යාලය.

# පිළිගැනීමේ කතාව



**ආචාර්ය ධර්ම කීර්ති ශ්‍රී රංජන්,**
**ජනමාධ්‍ය අධ්‍යයන අංශය,**
**ශ්‍රී පාලි මණ්ඩපය,**
**කොළඹ විශ්ව විද්‍යාලය.**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටෙනිසන් පෙරේරා මහත්මා, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර මහත්මා, කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස මහත්මා, ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන මහත්මා, අප මණ්ඩපයේ මණ්ඩපාධිපති ආචාර්ය ටියුඩර් වීරසිංහ මහත්මා, ජනමාධ්‍ය අධ්‍යයන අංශයේ අංශාධිපති, ආචාර්ය රංජන් හෙට්ටිආරච්චි මහත්මා, ප්‍රාසාංගික කලා අධ්‍යයනාංශයේ අංශාධිපති භාගේශ්‍රී ෆොන්සේකා මහත්මා, සබරගමුව විශ්ව විද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශයේ අංශාධිපති, ආචාර්ය මනෝජ් ආරියරත්න මහත්මා, සංගීත අධ්‍යක්ෂකවරු වන වීරසේන ගුණතිලක මහත්මා සහ විජේසේන කොඩිප්පිලි මහත්මාත්, නාට්‍යවේදී සිරිසේන ප්‍රේමලාල් මහත්මා, රුහුණු විශ්ව විද්‍යාලයේ හිටපු කථිකාචාර්ය උපුල් රණවීර මහත්මා ඇතුලු සම්භාවනීය සභාවෙන් අවසරයි.

අද දිනයේ ජනමාධ්‍යවේදය අධ්‍යයනය සහ විචාරය සංඥාර්ථවේදය වෙලුම 3 සහ වෙලුම 4 ත්, International Journal of Communicology අන්තර්ජාතික සඟරාවේ වෙලුම් 1 සහ වෙලුම් 2 ත් එළි දක්වන මොහොත තුල මෙම කෘති පිළිබඳව පමණක් නොව සමස්ත මාධ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව සංවාදයකට යමින් අදාළ තර්ක විතර්ක මතවාද ඔස්සේ විද්වත් කතිකාවක් සාර්ථකව සිදු

කිරීම අරමුණු කරගෙන අපට විශාල කාර්යභාරයක් පැවරෙනවා.

සාම්ප්‍රදායික ලෙස පොත් පිළිබඳව ගොඩනගන සාකච්ඡාවකට එහා ගිය, ශ්‍රී ලංකාවේ පමණක් නොව සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලන ක්‍රියාවලියෙහි ජනමාධ්‍යයේ භූමිකාව නැමැති ප්‍රධාන මාතෘකාව කේන්ද්‍රගත කරගනිමින් ගොඩනගන්නා වූ සම්භාව්‍ය කතිකාව මගින් මාධ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ විද්‍යාත්මක අර්ථ නිරූපනයන් සහ ජනමාධ්‍යයේ හැසිරීම, පුද්ගල සහ සමාජ සංවර්ධනයට එය දරන උපයෝගීතාව ආදී ප්‍රවේශ රාශියක් පිළිබඳව අවධානය මෙහි දී සිදු වෙනව. එම නිසා සාම්ප්‍රදායික රටාවෙන් මිදී Critical Discourse, නැත්නම් විචාරාත්මක ප්‍රවේශයට අනුගත වෙමින් මේ පිළිබඳ සාකච්ඡාව ඉදිරියට මෙහෙයවීමයි අපගේ බලාපොරොත්තුව.

ඇත්තටම මාධ්‍ය සහ සන්නිවේදනය එකිනෙකින් වියුක්ත කල නො හැකි සංයුක්ත ප්‍රවේශයක් තුළට කේන්ද්‍රගත වන ප්‍රධානතම සංකල්ප දෙකක් හැටියට දකින්න පුලුවන්. වර්තමානයේ සන්නිවේදන ක්‍රියාවලියටත් වඩා මාධ්‍යයේ ක්‍රියාවලිය ඉතාමත්ම ප්‍රබල වී ඇති ආකාරය අපට පැහැදිලි යි. ඉතිහාසයේ සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රියාවලිය එක්තරා භූගෝලීය සීමාවකට කේන්ද්‍රගත වන විට, නව මාධ්‍ය, අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය (Social Media) ආදී මාධ්‍ය උපාංග මූලික වෙමින් භූගෝලීය සීමාවන් ද අතික්‍රමණය කරමින් දැවැන්ත භූගෝලීය වපසරියක විහිදෙමින් ප්‍රබල සමාජ අන්තර් ක්‍රියාවලියක නිරත වන ආකාරය අපට දක්නට හැකි යි.

මාධ්‍ය ක්‍රියාවලිය නිසා ලෝකයේ සමාජ සංස්කෘතික වෙනස්කම් වේගයෙන් නිර්මාණය වෙමින් පවතිනවා. ගෝලීය සංස්කෘතික ප්‍රවාහයට පරිධියේ රටවල් ද ප්‍රවේශය ලබමින් තිබෙන බව පැහැදිලියි. සංස්කෘතික සංයෝජනයකට හෝ සංස්කෘතික වෙනසකට යාමට පෙර සංස්කෘතික ගැටුම් ඇති වන බව පෙනේ. නිදසුනකට ගතහොත් අප වැනි රටවල් තුල එම ගැටුම් නිර්මාණය වී ඇති ආකාරය අද අපට පැහැදිලි වෙනව. එම නිසා මෙවැනි මාතෘකා කාලීන වැදගත් කමක් දරනවාත් මෙන්ම මාධ්‍ය ආකෘති හැඩගස්වා ගැනීම සඳහා ද වැදගත් වන බව අපගේ අදහසයි.

මෙම විද්වත් මාධ්‍ය කථිකාව සඳහා අප විද්වතුන් කිහිප දෙනෙකුටම ආරාධනා කරනු ලැබුවා. විශේෂයෙන් ම සමාජ විද්‍යා සහ මානව විද්‍යා විෂය ක්ෂේත්‍රය පදනම් කරගනිමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු සහ සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුවේ ජ්‍යෙෂ්ඨතම මහාචාර්යවරයා වන ටෙනිසන් පෙරේරා මහත්මා ඉන් එක් අයෙක්. අපි ඒ මහත්මාව ආදරයෙන් සහ ගෞරවයෙන් මේ අවස්ථාවේ දී පිළිගන්නවා.

ඒ වගේම සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර මහත්මා - එතුමා විශේෂයෙන් සමාජ විද්‍යාව සහ අපරාධ විද්‍යාව ඇතුලු විවිධ පැතිවල නිපුණතාවන් දක්වමින් මාධ්‍ය ක්ෂේත්‍රය තුළ විශාල කාර්ය භාරයක් සමාජ විද්‍යාත්මක ප්‍රවේශය තුළින් ගොඩනගන ආකාරයක් අපිට දකින්නට පුලුවන්කම තියෙනවා. එතුමන්වත් අප මේ සාකච්ඡාව සඳහා ඉතා ගෞරවයෙන් පිළිගන්නවා.

ඒ වගේම කැලණිය විශ්ව විද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස මහත්මාවත් ඉතාමත් ආදරයෙන් පිළිගන්නවා. සන්නිවේදන විෂය ක්ෂේත්‍රය සඳහා විශාල සේවාවක් කළ සහ ලාංකීය සමාජය තුළ පමණක් නොව අන්තර්ජාතික සමාජය තුළත් සන්නිවේදන ක්‍රියාවලියේ වපසරිය ප්‍රසාරණය කිරීමට විශාල කාර්යභාරයක නිරත වන එතුමාවත් මේ සාකච්ඡාව සඳහා ඉතාමත් ගෞරවයෙන් පිළිගන්නා බව සඳහන් කරනවා.

ඒ වගේම ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන මහත්මා ප්‍රාසාංගික කලා ක්ෂේත්‍රය තුළ හා සමාජ විද්‍යාත්මක සහ මානව විද්‍යාත්මක ප්‍රවේශයන් තුළින් මේ සාකච්ඡාවට සම්බන්ධ වෙනවා.

ලාංකීය සමාජය තුළ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රබල හඬක් නංවන අප මණ්ඩපාධිපති ආචාර්ය ටියුඩර් වීරසිංහ මහත්මා ද ඉතාමත් ගෞරවයෙන් පිළිගන්නවා.

මෙම ආචාර්ය සහ මහාචාර්යවරු විවිධ විෂය ක්ෂේත්‍රයන් තුළින් පැමිණ නොයෙක් ශික්ෂණයන් නියෝජනය කරමින් ගොඩනගන මෙම කථිකාව හරබර වේවි. ඒ වගේම මෙයට සම්බන්ධ වන උපුල් රණවීර මහත්මාත්, මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂවරු වන ඩී. එම්.

එස්. දිසානායක මහත්මාත්, සංගීත ක්ෂේත්‍රයේ අධ්‍යක්ෂකවරයෙකු වන වීරසේන ගුණතිලක මහත්මා සහ විජේසේන කොඩිප්පිලි මහත්මාත්, සිරිසේන ප්‍රේමලාල් මහත්මාත්, සංගීත ක්ෂේත්‍රය තුළ සිටින අනෙකුත් අධ්‍යක්ෂකවරුන් මෙන් ම සිරස ප්‍රධාන නාලිකාවේ විශාල කාර්යභාරයක් ඉටු කරන අශෝක ඩයස් මහත්මාත්, ශ්‍රී පාලි මණ්ඩපය සමග දැඩි සම්බන්ධතාවක් ඇති ලේක් හවුස් මාධ්‍ය ආයතනයෙහි චන්දන විජේකෝන් මහත්මා ඇතුලු සම්භාවනීය අමුත්තන් සියල්ලත්, සමස්ථ විද්‍යාර්ථයින් ඇතුලු සපැමිණි ඔබ සියලු දෙනාත් ඉතාමත් ම ආදරයෙන් සහ ගෞරවයෙන් පිළිග න්නා බව සඳහන් කරමින් වැඩි කාලයක් නොගෙන පිළිගැනීමේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

# පළමු අදහස් දැක්වීම



**ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර,**
**සමාජ විද්‍යා සහ මානව විද්‍යා අධ්‍යයන අංශය,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**නුගේගොඩ.**

ආයුබෝවන්, හිතට ප්‍රීතියක් දනෙන ආකාරයේ විෂය තේමාවක් මූලික කොටගෙන අප මේ රැස්ව සිටින්නේ කොළඹ විශ්ව විද්‍යාලයීය ශ්‍රී පාලි මණ්ඩපයේ අරුන්දතී ශාලාවේ වැදගත් කටයුත්තකට. අප දෘශ්‍යරූප වලින් දුටු පරිදි සිංහල භාෂාවෙන් ප්‍රකාශයට පත්වන මේ කෘති දෙක සංඥාර්ථවේදී ප්‍රවේශය ජනමාධ්‍යවේදය, ජනමාධ්‍ය අධ්‍යයනය සහ විචාරය වෙලුම් 03 සහ වෙලුම් 04 නිකුත් වීමත්, සහ International Journal of Communicology - Volume 01 and 02 යන මේ සඟරා 02 නිකුත් වීමත් පිළිබඳව කතිකාවතක් ගොඩනැගීම ඉතා වැදගත්. අප ඉතා ගරු කරන ආදරණීය මහාචාර්යවරුන්, ආචාර්යවරුන් විශේෂයෙන් මෙහි මණ්ඩපාධිපතිතුමා ආදී විද්වතුන් මේ පළාතෙත් අපේ රටට නාට්‍ය ක්ෂේත්‍රයට, සංගීත ක්ෂේත්‍රයට ඒ වගේම ලේඛන කලාවටත් සේවය කළ විද්වතුන් කලාකරුවන් ඉන්නවා. පාසල් වල දරුවෝ ඉන්නවා. මෙම මණ්ඩපයේ විද්‍යාර්ථීන් ඉන්නවා. ඒ සියල්ලන්ගෙන්ම සහ පැමිණ සිටින ගුරුභවතුන් ඇතුලු සියලුම දෙනාගෙන් අවසරයි.

මම මේ කෘති හතර, මේ සඟරා හතර කියෙව්වා. ටික දවසකට කලින් තමයි එය අතට ලැබුනෙ. 2012 වර්ෂයේ අගෝස්තු මාසයට 03 වෙනි වෙලුම අයිතිවෙනවා. එහි ලිපි 08 ක් ද, 2013 දෙසැම්බර් 04 වෙනි වෙලුමට ලිපි 06 ක් ද ඇතුලත් වෙනවා. එහි තේමාව

වන්නේ සංඥාර්ථවේදය.

මේ ගැන කල්පනා කරන විට මට මතක් වුනා පකිස්ථානයේ හිටියා එක ක්‍රීඩකයෙක් අශ්වයෙක් වගේ දුවන අක්තාර් කියලා. ඔහු වේගවත් පන්දු යවන්නෙක්. ඔහු දැන් පිටියෙන් ඉවත්වෙලයි ඉන්නේ. ඔහු විකට්ටුවක් දවා ගත්තම දබරැඟිල්ල කෙලින් කරගෙන ඉස්සරහට දුවගෙන ඇවිල්ලා ඇඟිල්ල ඔසවනවා. ක්‍රීඩා විනිශ්චයකාරවරු දැවී ගියා කියලා කියන්න ඇඟිල්ල ඔසවනවා. විවිධ ශෛලීන් ඉදිරිපත් කරනවා. එය ප්‍රේක්ෂකයෝ තේරුම් ගන්නවා. ක්‍රිකට් ක්‍රීඩා ලෝලීන් අත්පොලසන් දෙනවා. දැවී ගිය පුද්ගලයා ඉවත්වෙලා යනවා.

ඇමෙරිකාවේ පාරේ යන වාහන සාමාන්‍යයෙන් නලා නාද කරන්නේ නැහැ. යම් කිසි වැරුද්දක් කළොත් එහෙම නැත්නම් පාරේදී නොහොබිනා අශික්ෂිත ක්‍රියාවක නිරත වුවහොත් ඇමෙරිකන්කාරයෝ මැදඟිල්ල පෙන්වනවා. එසේ කළවිට අනෙක් වාහනයේ වැරැද්ද කළ මිනිහට ලැජ්ජ හිතෙනවා. මේක අපේ භාෂාවෙන් කියනවා නම් මේ සභාවේ කියන්න බැරි විදියට දෙමව්පියෝ මතක් කරලා තමයි මේ බනින්නේ.

අපි සාමාන්‍යයෙන් නිතරම වාහනවල නලා නාද කරනවා. දෙමව්පියෝ සිහි කරනවා. ජීවිතයට ඒ වගේ දේවල් නොකියන කට්ටියත් අපි දැකලා තියෙනවා. දැන් රංජන් මහත්මයත් ඉන්දියාවේ ඉගෙන ගත්ත කෙනෙක්. මෙතන මනෝජ් මහත්මයත් හිටියා. මමත් ඉන්දියාවේ ඉගෙනගත්ත කෙනෙක්. ඉන්දියාවේ විශේෂයෙන් අම්මට තාත්තට ගරු කරනවා. මව මතක් කරලා බනිනවට වඩා ඉන්දියාවේ කට්ටියට හුඟක්ම කේන්ති යන්නේ **බැහැන්ජී** (සහෝදරිය) මතක් කළොත්. සමහර කට්ටිය ඇඟිලි වලින් එය කියනවා. ඒ රටේ ක්‍රිකට් ක්‍රීඩකයා ජයග්‍රහණය දබර ඇඟිල්ලෙන් කියද්දී එය තවත් රටක මිනිස්සුන්ට එය කුණුහරපෙන් බැනීමක් වෙන්න පුලුවන්.

දැන් මේක තේරුම් ගැනීම තුළ සංඥාර්ථවේදය කියලා කතාවකුත් තියෙනවා කියලා මට හිතුනා. සනත් නන්දසිරි කියන සංගීතවේදියා දවසක් පැවසුවා ඇමෙරිකානු තානාපති කාර්යාලයේ තුන් වෙනි ලේකම් කලු ජාතිකයෙක් කියලා.

ඔහුගෙන් එතුමා මෙහෙම ඇහුවලු. මහත්තයා ඇයි මේ ඔබගේ රටේ සිංදු කණ්ඩායම් වල ළමයි සිංදු කියනකොට ගිටාර් ගහලා මෙහෙම මෙහෙම කරන්නේ කියලා. එතකොට සනත් මහත්තයා කිව්වලු ඒක මම දන්නේ නැහැ කියලා. ඒක ශෛලියක්, style එකක් වෙන්න ඇති කියලා. එතකොට ඔහු කිව්වලු ඒ අපේ රටේ, ඒ කියන්නේ අප්‍රිකාවෙන් ආපු අය ඇමෙරිකාවේ සුද්දන්ට අමු තිත්ත කුණුහරපෙන් බනින භාෂාව ඒක තමයි කියලා. වෙන වචන වලින් කියනවානම් භාෂාව Silent Language එක තුළත් තියෙනවා.

එතකොට අපේ බුදුපිළිම වල අපේ බුදුරජාණන් වහන්සේගේ නිරූපණ කලාවේ ප්‍රතිමා කලාවේ ඒවා ගැබ් වෙනවා. ඒ ගැන ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන මහත්මයා බෙහෙවින් දන්න කෙනෙක්. ඒ ගැන එතුමා හොඳටම කියලා දෙයි. විවිධ මුද්‍රාවන් තියෙනවා. භූමි ස්පර්ශ මුද්‍රාව, අභය මුද්‍රාව ආදී වශයෙන්. බුදුපිළිම වල ඇඟිලි සකස් කරලා තියෙන්නේ ඒ ආකාරයට. දැන් ඇමෙරිකාවේ තවත් ක්‍රමයක් තමයි සුළැඟිලි දෙක එකට දම්වැලකින් වගේ එකිනෙකින් බැඳලා ප්‍රතිඥාවක් කරන එක. ඒක කරන්නේ ආදරය කරන කට්ටිය. ඒ දෙන්නගේ අතර තියෙන රහස් කාටවත් කියන්නේ නැහැ කියලා තමයි මේ විදියට ප්‍රතිඥාවක් කරන්නේ.

අපි කවුරුත් කියවලා තියෙනවා ඒ කාලේ මළවුන්ගේ අවුරුදු දා වගේම මළගිය ඇත්තෝ කියන පොත්. ඒ පොත්වල සරච්චන්ද්‍ර මහත්තයා ලියලා තිබුනා සුළැඟිලි පටලා පිළින තැබුවා කියලා. පිළින කියන්නේ ප්‍රතිඥා කියන එක. ආදරයෙන් බැඳුනා කියන එක. ආදරය බිඳ දමන්නේ නැහැ කියන එක.

අපි පුංචි කාලේ ඉස්කෝලේ යනකොට මෙහෙම කරලා එකක් කරනවා. එහෙම කරල මුහුණ ඇඹුල් කරගෙන ඉන්නවා. මේවා එක්තරා ආකාරයකින් සංඥාවන්. ඒ වගේම සංකේත. මේවා තේරුම් ගන්න එක ගොඩක් වැදගත්. මෙය නර්තනයෙත්, සංගීතයෙත් තියෙනව. දැන් අමරදේව මහත්තයා ගායනා කරන කොට තිසා වැවයි සීගිරියයි කියල විවිධ මුද්‍රා දක්වනවා. නිහාල් නෙල්සන් වැනි කෙනෙක් මයික්‍රෆෝනය අතට අරගෙන බඩ යටින් අරන්, කකුල් යටින් අරන් කරකවනවා. ප්‍රාසාංගිකත්වය තබා ගන්න වෙන්න ඇති එතුමා එහෙම කරන්නේ. ඒ වගේම ආකර්ෂණභාවය

තබා ගැනීමටත් එතුමා මේ විදිහට මයික්‍රෆෝනය කරකවනවා. හැබැයි අපි එය තේරුම් ගත්තා කියමු. නමුත් අපේ රටේ ඇතැම් නැටුම් වල තියෙන මුද්‍රා අපේ ප්‍රේක්ෂකයෝ තේරුම් ගන්නේ නැහැ. යම් යම් මුද්‍රාවන්, ඇහි බැම, මුහුණේ පොඩි පොඩි මාංශ පේශී චලනය කිරීම්, ඇඟිලි වලින් කරන දේවල්, ඒ වගේම ඇගේ හැඩතලවලින් කරන දේවල් මෙහි අන්තර්ගත වෙනවා.

මේ පොත් හතර තුළ ඉංග්‍රීසියෙන් හා සිංහලෙන් ඇතුළත් වෙලා තියෙන සාරගර්භ, ශාස්ත්‍රීය, පර්යේෂණාත්මක ලිපි මගින් මේ කාරණය නූතන භාෂාවෙන් පර්යේෂණාත්මකව ශාස්ත්‍රීය ලෙස ලෝකයේ විද්වතුන් විසින් ඉදිරිපත් කර ඇති මත සමග ඉදිරිපත් කරලා තියෙනව. ඒ සමගින් පාඨකයාට කියවන්නට අවස්ථාවක් ලබා දී ඇති බව පැහැදිලි යි. මෙය ඉතා ප්‍රශංසනීය වෑයමක් බව මුලින්ම කිව යුතුයි.

අපේ රටේ සංස්කෘතියේ ඈත අතීතයේ තිබුණු දෑ සංකේත ආදියෙන්, සංඥාවන් ආදියෙන් මතු වෙනවාද, අද නිරූපණය වෙනවාද, කියන එක ප්‍රශ්නයක්. ඇගේ තියෙන කොටස් වලට සාහිත්‍යයෙන් විවිධ නම් තියෙනවා. අපට හොඳ සාහිත්‍යයක් තිබුණා අනුරාධපුර යුගයේ ඉඳලා ගලා ගෙන එන. ජනශ්‍රැති සාහිත්‍යයකුත් තියනවා. සම්භාව්‍ය ගද්‍ය, පද්‍ය, චම්පු කියන සාහිත්‍යධාරා තුනකුත් තියෙනවා. එතකොට අපි අද ඒවා හදාරන්නේ නෑ. මේ සංඥාර්ථවේදය කියන විෂය Semiotics, Semiology කියන දේ ඊට පස්සේ සංකේත පිළිබඳව කතා කරන කාරණා, භාෂාව පදනම් කරගෙන ලෝකයේ මතුකරපු කාරණා. භාෂාවයි සන්නිවේදනයයි බිහිවන්නේ මිනිස්සු අතරේ.

ඇගේ කොටස් වලට එක එක නම් කියනවා එක එක පළාත් වල. දැන් ඉන්දියාවේ බරණැස් නුවර, අපි ඉගෙන ගත්ත විශ්ව විද්‍යාලයේ ආයුර්වේදයත්, බටහිර වෛද්‍ය පීඨයත් එකිනෙක යාබඳව තිබුණේ. මේ දෙපැත්ත ම ඉගෙන ගන්නවා. කවුරුත් මොන භාෂාවෙන් ඉගෙන ගත්තත් සාමාන්‍යයෙන් හින්දි තමයි ප්‍රධාන ම. නමුත් ඉංග්‍රීසියෙන් ඉගෙන ගන්නේ. සියලු දෙනාම එක භාෂාවකින් තමයි ඉගෙන ගන්නෙ. ගමේ භාෂාව, බෝජ්පුරි. බෝජ්පුරි භාෂාව ගමේ මිනිස්සුන්ගේ. මෙම වෛද්‍යවරු යන්නේ

ගමට සේවය කරන්න. ඈත පළාත් වලට ගියාම ඒ ගම්වල මිනිස්සු කතා කරන්නේ ගමේ භාෂාවෙන්. කතා කරලා ශරීරයේ කොටස් ගැන අහන්නේ ගමේ භාෂාවෙන්. එනම් ව්‍යවහාරික භාෂාවෙන්. ව්‍යවහාරයෙන් එන යෙදුම් තේරුම් ගන්නට වෛද්‍යවරයාට හැකි විය යුතුයි. ලංකාවෙත් මෙහෙම තියෙනවා. අපි මේ ගැන අවධානය යොමු කර තිබෙන්නේ කොපමණ ගැඹුරින් ද? මට හිතෙනවා ඒ ගැන තියෙන දැනුම අඩුයි කියලා.

ඊළගට ඥානය කියන එක පිළිබඳ දැනුම. ඥානය, ප්‍රඥාව කියලා අපි හොයාගෙන යන දේවල් මොනවාද? කාලයට ඉහත මට කියවන්න ලැබුණා ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සංගමයේ ලිපි එකතුවක්. එහි අසංග තිලකරත්න මහාචාර්යවරයා ලියලා තිබුණා ලිපියක්. ඥානයෙහි අව්‍යාජත්වය පිළිබඳ ගැටලුව කියලා. ඒ ලිපිය ගැඹුරුයි. තේරුම් ගන්න ටිකක් දුෂ්කරයි. හත් අට සැරයක් කියවන එක හොඳයි. මේ ගැන කල්පනා කරල ලියූ දාර්ශනිකයෝ හිටියා.

මට සංඥාර්ථවේදයේ නූතන දේවල් ගැන තියෙන්නේ අල්ප දැනුමක්. නමුත් මම දැඩි කැමැත්තෙන් ඉගෙන ගන්නවා. බුදු දහම ඇතුලෙ තියෙන වචන. ඒවා වෙනත් භාෂාවකට පෙරලන කොට තියෙන අර්ථවල තත්වයන් පිළිබඳව ආසාවෙන් ඉගෙන ගන්නවා. ඉගෙන ගන්න උත්සාහ කරනවා. පාලි භාෂාවට අදාලව Pale Text Society කියල සංගමයක් හැදිලා තියෙනවා. නමුත් පසු කාලීනව උගතුන් කියනවා දුක්ඛ වැනි වචනත්, ඒකට දීලා තියෙන ඉංග්‍රීසි වචනත්, සහ වෙනත් භාෂාවලින් දීලා තියෙන වචනවලටත් තියෙන්නේ නියම ගැඹුරු අර්ථය නොවෙයි කියලා. භාෂාවේ තියෙන්නේ හඬ කැබලි, වාග් සංකේත පද්ධතියක්. මේ හඬ කැබලි වලටත් හැඩයක් තියෙනවා, Vocal Symbols කියලා. එතකොට ඒවා පිළිවෙළකට විධිමත් සංවිධානයක් යටතට ගන්නවා. ඊට පස්සේ ඒ අකුරු වලින් පද හදාගෙන, වචන හදාගෙන ඒවා නිසි විදිහට වැකියක පිහිටෙව්වම අර්ථ මතුවෙනවා. මෙය තේරුම් ගන්න ඕන. වාග් සංකේත පද්ධතිය තුළිනුයි සමාජයට අර්ථ දෙන්නේ. මිනිස්සු කාලාන්තරයක් තිස්සේ මේවාට අර්ථ සපයනවා. එතකොට භාෂාවක් කියන්නේ එබඳු දෙයක්. මේ බව පැරණිම නිර්වචනවල කියලා තියෙනව. පසු කාලීනවත්

මේවා ගලා එනවා. එතකොට මානවයාගේ යම් කිසි මොළේ දියුණුවක් එක්කම ඊට පෙර ලෝකයේ තියෙන දේවල් කොහොමද ඥානනය කළේ. සංජානනය කියලා වචනයක් ඉගෙන ගන්නවා අලුත් සමාජයේ Perception කියලා. කොහොමද මේක තේරුම් ගන්නේ ? දැන් අපි නිතරම පාවිච්චි කරන වචනයක් තමයි සංවේග යට පත්වුණා කියන එක. නැත්නම් පහන් සංවේගය කියන වචනය. අපට දැනෙන්නේ වියෝ දුකක්. හැබැයි රහත් භාවය ගැන විස්තර කරන තැන්වල එය වෙනම විදිහකට විග්‍රහ කරලා තියෙනවා. එතකොට පටලැවිල්ලක් ඇති වෙනවා. ඒ නිසා රවීන්ද්‍රනාත් තාගෝර්තුමා වංග භාෂාවෙන් ලියපු ගීතාංජලී අර ඉංග්‍රීසි දන්න ඊට්ස් ව හමුවෙලා සියලුම පෙළවල් පරිවර්තනය කරල නෑ. පරිවර්තනය කරල තියෙන්නෙ අඩුවෙන්. ඔවුන්ටත් ප්‍රශ්නයක් වුනා මේ ලියලා තියෙන දේවල් හරියටම තමන්ගේ ඒ භාෂාවෙන් කියපු හැඟීම් ප්‍රකාශනය, ඉංග්‍රීසි භාෂාවෙන් කියවුනාද කියලා. මේ ගැන ගැඹුරු සාකච්ඡාවක් තමයි මේ පොත් හතරෙන් ඉදිරිපත් කරන්නේ. එහිදී නර්තනය පැත්ත කතා කරනවා. සංගීතය පැත්ත කතා කරනවා. රූපවාහිනිය පිළිබඳවත් කතා කරනවා. බුදු දහමේ කොහොමද මේ අංශයේ ගමන් කරන්නේ කියලා කතා කරනවා. නූතන භාෂා භාවිතයන් පිළිබඳ සාකච්ඡා කරලා තියෙනවා.

ඉතිං මට හිතුනා දැන් මේ මාසයේ මානවසිංහ මහත්තයා ඉපදිලා අවුරුදු 100යි. මානවසිංහ මහත්තයා ඉපදිලා අවුරුදු 100 වගේම මඩිහේ පඤ්ඤාසීහ හිමි ඉපදිලා අවුරුදු 100. එතකොට මානවසිංහ යනු ශාස්ත්‍රාලයීය අධ්‍යාපනයක් ලබල විශ්ව විද්‍යාලවලට, ඉස්කෝල වලට ගිහින් ආපු කෙනෙක් නොවෙයි. හැබැයි එතුමා භාෂාවෙන් කතා කරන සංඥා සංකේත මේ ගැන ඒ ආකාරයේ පාරිභාෂිත වාග් කෝෂයක් නොමැති වුවත් විශ්වය පිළිබඳ, මනුෂ්‍යයාගේ ජීවිතය පිළිබඳව, මිනිසා - පිරිමියා - ගැහැණිය ගමන් කරන විලාසය, කඳු වැටි ජලදහරා ගලා හැලෙන හැටි, නර්තනය, ගායන ලීලාව, භාෂාවේ ශක්‍යතාවයන් පිළිබඳව පුදුම රසවින්දනයක් මවලා තියෙනවා. එහිදී මානවසිංහ රිද්ම කියන වචනය කතා කරලා තියෙනවා. රිද්ම කියන වචනයට ඔහු දෙන්නේ ලතාව කියන වචනය. ලීලාව, ලතාව කියන ඒව. මානවසිංහයන්ගේ ලේඛනය

තුළ වගේම මහගමසේකර අපේ විශ්වවිද්‍යාලයකට ඉදිරිපත් කළ නිබන්ධනය - සිංහල ගද්‍ය පද්‍ය නිර්මාණ ලක්ෂණ කියන පොතත් මට මතක් වෙනවා. අවාසනාවකට එම කෘතිය මුද්‍රණය කිරීමේදී සෑහෙන්න දෝෂ ඇවිත් තියෙනවා අක්ෂර කරණයේදී පරිගණකයෙන්. නැත්නම් එහි ඉතා විශිෂ්ට දැනුමක් එකතු කරලා තියෙනවා. මේ දෙයම වගේ දෙයක් මකුලොලුව මහත්තයාගේ හෙළ ගී මගේ තියෙනවා. විශාල උත්සාහයක් දරලා අපි මේවා කොච්චර දුරට හදලා තියෙනවාද? මේවා ගැන හුඟාක් උනන්දු වෙච්ච කෙනෙක් ආනන්ද කුමාරස්වාමි. ආනන්ද කුමාරස්වාමි ගැන අපි කොච්චර දන්නවද? සෙනරත් පරණවිතාන අනිත් පැත්තෙන්. මුනිදාස කුමාරතුංග මහා භාෂා ප්‍රාඥයෙක්. එතකොට ප්‍රාචීන භාෂා දැනුම ගෙනාපු යතිවරුන් වහන්සේලා. ලබුගම ලංකානන්ද හාමුදුරුවෝ පොත් කරලා තියෙනවා. මේවා අපිට නව පරපුරේ අය හැටියට කියවලා තේරුම් ගන්න අමාරුයි. නමුත් ඒවා කියවිය යුතුයි. ඒවා කියව ගත්තතොත් විශාල ඥානයක්, ප්‍රඥාවක් අප තුළ එකතු වෙනවා. ඒ දැනුමත් එකතු කරගෙන නිශ්චිත ගමනක් යන්න පුලුවන්. මොකද හේතුව රූපවාහිනිය දිහා බලාගෙන ඉන්න කොට සමහර නාලිකාවන් වලට සවන් දෙනකොට අපිට පේනවා අපි හුඟාක් නිසරු අත්දැකීම් ලබන්නේ කියලා. අපේ හිතට හදවතට කාවදින අත්දැකීම් නිසරුයි. මොකද නිසරු අත්දැකීම් ලැබෙන කොට ග්‍රහණය වන අපේ හදවත හරිම නිසරුයි. අපි ඉන්නේ අල්පභාෂිත, අල්පශ්‍රැත අය විදිහට. කිසිම දෙයක් දන්නේ නැහැ. ඔහේ ජීවත් වෙනවා. කනවා, බොනවා, කසාද බඳිනවා, ළමයි හදනවා, ජීවත්වෙනවා, රස්සා කරනවා. ජීවිතය යනු මේක ද? ජීවිතය යනු මෙය නොවේ. ඊට වඩා රසවත් වූ සංස්කෘතික ශිෂ්ටාචාරයක් ලෝකය ගොඩනගලා තියෙනවා. ඒවා සොයා යාම කරන ලද උත්සාහයක් ලෙස තමයි මේ කෘති හතර අප දකින්නේ. එහි ඇතුලත් ලිපි දකින්නේ.

එතකොට සංඥාවක් යනු යම්කිසි සංකල්පයක්, වස්තුවක් නියෝජනය කරන්නා වූ ද, ආදේශ කරන්නා වූ ද, විෂය මූලික පරිසරය තුළ ඇති භෞතිකමය, ද්‍රව්‍යමය ප්‍රකාශනයක් වශයෙන් නිර්වචනය කරලා තියෙනවා. මට මතකයි පරණවිතාන මහත්මයා

ලියලා තියෙනව තැනක Symbol , symbolic කියල. අපි ඒ දේවල් පිළිබඳව අර්ථ හොයනවා. Symbol කියලා කියන්නේ සංකේත වලට. එතුමා සඳහන් කරලා තියෙන වචනය තමයි **නිමිතීකරණය** කියන වචනය.

අපේ ජීවිතය නූතනත්වය ඇතුළට ගියත් පෙරදිග මූලයන් අපේ ඇඟේ ස්නායුවල තියෙනවා. පෙරදිග මිනිස්සු ආදරය කොහොමද ප්‍රකාශ කරන්නේ. පෙරදිග මිනිස්සු කොහොමද ඒක සන්නිවේදනය කරන්නේ. පෙරදිගමිනිස්සු කොහොමද ලිංගිකත්වය ප්‍රකාශ කරන්නේ. රෝග පීඩාවක්, මනසේ රෝගයක් වෙන්නත් පුලුවන්. එහෙම නැත්නම් කයේ පීඩාවක් කොහොමද ප්‍රකාශයට පත් කරන්නේ. එවිට එය ග්‍රහණය කරගන්නා වූ අනික් පුද්ගලයා එය තේරුම් ගන්නේ කොහොමද කියන මේ අන්තර් ක්‍රියාව හොඳට වැටහිලා, හොඳට ගැඹුරින්, වටහා ගත්තොත් එතන තමයි ජීවිතේ රස සහ අරුත් මතුවන්නේ. අන්න එබඳු ගමනකදී අද දිනයේ මේ මණ්ඩපයේ ඉදිරිපත් කරන මේ කෘති හතර වැදගත් වෙනවා. ඒ නිසා මම අවසාන වශයෙන් මෙහි කෘති දෙකක් ඉංග්‍රීසි භාෂාවෙනුත් ලියා තිබෙන නිසා වචන දෙක තුනක් ඉංග්‍රීසි භාෂාවෙනුත් සටහන් කරන්න කැමතියි.

I had the opportunity to go through these issues of international journal of communicology. I consider this as a revolutionary step in the field of media research. Since we live in a media Society we need these kind of academic discourses for the progress of media. In journal 01 and in journal 02 consists of 8 articles. They are blind pear review articles. I appreciate this effective efforts and wish you all the best in your future activities.

Blind Pear Review කියන එක ඉතා වැදගත්. අද ලංකාවේ සමාජයීය විද්වත් ක්ෂේත්‍රය සහ මානව ශාස්ත්‍ර කියන මේ ධාරාව ගැන අපට කිසිම සතුටක් නැහැ. අපට තියෙන්නේ අසතුටක්. කතා කරන්නට ඕන මෙම දෙවල් පිළිබඳව. ඇද පලුදු හඳන්න ඕන. විශාල සංක්‍රාන්තික, අශික්ෂිත, ජඩ දේවල් සිද්ධවෙන නූතන සමාජයක අපි ජීවත් වෙන්නේ. එහිදී විශාල වැඩ කොටසක් මාධ්‍යයට කරන්න

පුළුවන්. අපි හිතනවා එය කරන්නේ නැහැ කියලා. එය වගකීමෙන් කියන්නේ. එය නොකරනවා නම් ඒ ඇයි ද කියන එක පිළිබඳව ගැඹුරු කතිකාවතක් අපට අවශ්‍යයයි. ඒ නිසා අධීන වූ, ස්වාධීන වූ මාධ්‍යයක් සහ පොලිසියක්, අධිකරණ ක්‍රමයක්, අධ්‍යාපනයක් අපට අවශ්‍ය වෙනවා. ඒක පාසල් අධ්‍යාපනය වගේම උසස් පෙළ අධ්‍යාපනය, විශ්වවිද්‍යාල ආදී උස්මිටි නැති අධ්‍යාපනයක් විය යුතුයි. අන්තර්ජාතික පාසල් වල උගන්වන හා රජයේ පාසල් වල උගන්වන දේ අතර අහස පොළොව වගේ වෙනසක් තියෙන්නේ. අන්තර්ජාතික පාසල් වල ළමයි ඉතිහාසය කරනවා. අපි ඉතිහාසය කරන්නේ නැහැ. ඔවුන් පෙර අපර දෙදිග සාහිත්‍යකරුවන් නාට්‍යකරුවන් ගැන ඉගෙන ගන්නවා. අපේ ළමයි දන්නේ නෑ. ශේක්ෂ්පියර් දන්නෙ නැහැ. තාගෝර් දන්නෙ නැහැ. චෙකොෆ් දන්නෙ නැහැ. ටෝල්ස්ටෝයි දන්නෙ නැහැ. මාර්ටින් වික්‍රමසිංහ දන්නෙ නැහැ. අඩුගානේ අමරදේව දන්නෙත් නැහැ. සරච්චන්ද්‍ර කව්ද කියල දන්නෙ නැහැ. පරණවිතාන දන්නෙ නැහැ. මේ වගේ ගැටලුවක් තියෙනවා.

මම දොස් කියනවා නෙමෙයි. අපට වැරදිලා තියෙන්නෙ. අපි මෙයට අදාළ හේතු හෙව්වොත් පුලුවන් වෙයි ලොකු දෙයක් මේ රටට කරන්න. එහිදී වැදගත් වෙනවා දන්න අඳුනන අයට යවලා තමන්ගේ ලිපි පරිවර්තනය කරගන්නේ නැතිව, දන්න අයට යවලා තමන්ගේ ලිපි විවරණය කරගන්නේ නැතිව, නොදන්න අයට යවලා ලිපි බලවන එක. Blind Pear Review Journal එකක් කියන්නේ ඒකයි. ඒ වගේ දෙයක් කරන්නට දරන ලද උත්සාහය ඉතාම ප්‍රශස්ත හැටියට හඳුන්වමින් මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මණ්ඩපාධිපතිතුමාටත්, රංජන් මහත්වරු දෙදෙනාත් ඇතුලු සියලු දෙනාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

# දෙවන අදහස් දැක්වීම



**මහාචාර්ය ටෙනිසන් පෙරේරා,**
**සමාජ විද්‍යා සහ මානව විද්‍යා අධ්‍යයන අංශය,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,**
**නුගේගොඩ.**

**ප්‍රශ්නය :-**

**ප්‍රනීත් අබේසුන්දර මහතා තම දේශනයේ දී අදහස් දැක්වූවා අද සමාජ ක්‍රියාවලිය ජඩ, දුෂ්චරිත තත්ත්වයට පත් වී ඇති බැව්. සංකීර්ණ සමාජය තුළ ජනමාධ්‍ය භූමිකාව වශයෙන් ඔබතුමා අදහස් කරන්නේ කුමක් ද?**

**පිළිතුර :-**

වර්තමාන සමස්ත ජනමාධ්‍ය ක්‍රියාවලියම දේශපාලන මුහුණුවරක් ගෙන ඇති බැව් පැහැදිලිව පේනව. අපි ජීවත් වෙන්නේ සංවිධානය වූ සමාජයක. ඉස්සර අපි ඉපදුණේ ගෙවල්වල. දැන් අපි ඉපදෙන්නේ රෝහල්වල. ලේඩි රිජ්වේ එකේ. නැත්නම් කාසල් එකේ. ඒ සංවිධානය වූ සමාජයක් නිසා. වැඩි කලක් අපේ ජීවිත ගතවෙන්නේ සංවිධානත් සමඟ. අධ්‍යාපනය ලබන්නෙත් සංවිධානයන් තුළ. පාසල්වල අපි ඉන්නව. විශ්ව විද්‍යාලවල අපි ඉන්නව. මැරෙන්නේ කොහේ ද? ඉතිහාසයේ නම් ගෙදරින් මිනිය අරගෙන ගිහිල්ල කැලේට තමයි දාන්නෙ. දැන් එහෙමද? දැන් ඒක වෙනස් විදිහට සංවිධානය වෙලා. මිනිස්සු මිය ගියාම අද වන විට බානී රේමන්ඩ් හෝ ජයරත්න වැනි මල් ශාලාවල තියල තමයි කටයුතු කරන්නෙ.

ඔය සංවිධානය වූ සමාජ වල සංකීර්ණ ක්‍රියාවලියක් ගොඩනැගිල තියෙනව. සංවිධාන වැඩි වෙන්න වැඩි වෙන්න සමාජය සංකීර්ණ වෙනව. එය සමාජ විද්‍යාව තුළ ගැඹුරින් සාකච්ඡා

කරනව. ඒ තත්ත්වය තුළ සන්නිවේදනය වැනි විෂයකට ඉමහත් වූ දායකත්වයක් නැතහොත් උත්තුංග කාර්ය භාරයක් කරන්න පුළුවන්. සංකීර්ණ සමාජය තුළ පවතින සියලු තත්ත්වයන් විකෘති වෙලා තියෙනව. උඩු යටිකුරු වෙලා තියෙනව. මෙයට පෙර මේ පිළිබඳ ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර ශූරීන් විශ්ලේෂණය කළා.

සන්නිවේදනය තුළිනුත්, ජනමාධ්‍ය තුළිනුත් සමාජයේ ආකල්ප වෙනස් කළ යුතු යි. වැරදි ආකල්ප වර්ධනය වීමක් හා හොඳ ආකල්ප ඇත් වීමක් අප සමාජය තුළ සිදුවන ආකාරයක් පේනව. සමාජ විද්‍යාත්මක වශයෙන් බලන විට සමාජයේ මිනිසුන් තුළ සාහිත්‍ය පිළිබඳ, ඉතිහාසය පිළිබඳ නිවැරදි දැනුමක් නැහැ. දැනුම තුළින් නව ආකල්ප අපට ගොඩනැංවිය හැකි විය යුතු යි. පෙර තිබුණු සමාජ ලෙස සමාජය සකස් විය යුතු යි. එයින් අදහස් වන්නෙ නැහැ අපි සම්ප්‍රදායට යන්න ඕන කියල. අපි නවීන ලෝකයට යන්න ඕන. ඒ යනකොට අපට අවශ්‍ය වෙනව අපේ සංස්කෘතිය තුළ තියෙන වැදගත් දේවල් අරගෙන, වැරදි ආකල්ප වෙනස් කොට ජීවිතය හැඩගස්වා ගන්න. වැරදි ආකල්ප සකස් කිරීමේදී ජනමාධ්‍යයෙන් කරන්න පුළුවන් සේවය අති උදාරයි. එම සේවය ලබා ගැනීම සඳහා යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්නට නම් ඒ ක්‍රියා මාර්ගයට යම් ප්‍රවේශයක් මෙම කෘති තුළින් ගන්න පුළුවන්. ඉතා වැදගත් දෙයක් වෙන්නෙ අපි මේ සංකීර්ණ සමාජයේ ජීවත් වන විට සමහරුන් විශ්වාස කරනව ඇදේට යන සමාජයක අපිත් ඇදේට ගියාට කමක් නෑ කියල. ඒක මහා මිත්‍යාවක්. මිනිස්සු ඒ අඳුරෙ යනව. ඒ අඳුරෙන් මිදිල ආලෝකයට යන්න පුළුවන් නම් ඒක ඉතා වැදගත්. ජනමාධ්‍ය තුළින් සමාජයට වැදගත් දෙයක් දෙන්න ඕන.

දැන් සංස්කෘතිය ගත් විට, ගැමි සංස්කෘතිය එකක්. නාගරික සමාජ සංස්කෘතිය තව එකක්. මේවායේ තියෙන වැදගත් දේවල් අරගත යුතු යි. සංස්කෘති විවිධයි. උදාහරණ ලෙස ලෝකයේ ආචාරවිධි විවිධයි. ලෝකයේ තියෙන සංස්කෘතික විවිධත්වය ජනමාධ්‍ය විසින් තේරුම්ගෙන ක්‍රියාත්මක විය යුතුයි. ශ්‍රී පාලි මණ්ඩපය එම ක්‍රියාවන් සමාජගත කිරීම සඳහා විශාල උත්සාහයක් ගන්නව. එම සියලු කටයුතු සාර්ථක වේවා කියල මම ප්‍රාර්ථනා කරනව.

ස්තුතියි.

# තෙවන අදහස් දැක්වීම



**මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,**
**ජනසන්නිවේදන අධ්‍යයන අංශය,**
**කැලණිය විශ්වවිද්‍යාලය.**

**ප්‍රශ්නය:-**

**රටේ ලෝකෙ බුද්ධිමතුන් සිටිනව. අප විශ්වාස කරනව ඔවුන් අපි වෙනුවෙන් දෙයක් කරයි කියල. ඔවුන් දේශාලනීයකරණය වෙලා නැද්ද? මාධ්‍ය දේශපාලනීයකරණය වෙලා නැද්ද? ඔබට මේ සම්බන්ධව පිළිතුරක් ඇති.**

**පිළිතුර:-**

ජනමාධ්‍ය පිළිබඳ කතිකාවට මහාචාර්ය ටෙනිසන් පෙරේරා මහතා හොඳ ප්‍රවේශයක් දුන්නා. ඔහු කියනව වගේ එක්තරා ආකාරයක ප්‍රකාශන නිදහස කියන එක සංකල්පයක් විතරයි. එක් එක් සමාජවල, එක් එක් සමාජ වකවානුවල, ඒ ඒ දේශපාලන ක්‍රමයට සාපේක්ෂව තමයි එය නිර්වචනය වෙන්නේ. සුපිරි නිදහසක්, වඩාත් ශුද්ධ වූ නිදහසක් අපේක්ෂා කරනව නම් එය එක්තරා ප්‍රායෝගික ක්‍රියාවක් හැටියට හිතන්න බෑ. මා පෞද්ගලිකව හිතන දෙය තමයි සමාජ සංවර්ධන මට්ටම්වලට අනුරූපව සමාජ වගකීම් දරාගන්න නිදහසක් තිබිය යුතු යි කියල. වඩාත් සරල උදාහරණයක් කිව්වොත් මේ රටේ සිදු වූ සිදුවීමක් සැලකුව හොත් 1983 ජූලි කලබල සිද්ධිය. මේ සිද්ධිය සිදුවීම පිළිබඳව කියන්න ගිහින් සිදු වුණු විනාශය අපි දැක්ක. දැන් දවස පත්තරය අරන් බලන්න. 1983 ජූලි කලබල වෙච්ච දවසේ ඒ සිදුවීමට සමාන්තරව සිදුවුණු

සංත්‍රාසජනක හැඟීම අධිපතියාගේ බලධාරයාගේ කෝණයෙන් කියන්න ගොස් එමගින් සමාජයේ සිදුවූයේ ඛේදජනක තත්ත්වයක්. මම හිතන්නෙ නෑ මේක නිදහස කියල. මම පෞද්ගලිකව හිතන්නෙ මාධ්‍යකරුවා එවැනි ප්‍රවෘත්තියක් ගතහොත් ඒක වගකීම විසින් කළමනාකරණය කළ යුතු යි. උදාහරණයක් විදිහට එම ප්‍රවෘත්තියම ඇත්ත පත්තරයේ කොහොමද පළ කළේ? එම ප්‍රවෘත්තියම සමකාලීන ලංකාදීප පත්තරේ පළ කලේ කොහොම ද? එවකට තිබුණු දිනමිණ පුවත්පතේ කොහොමද පළ කලේ? මේවා තුලනය කරන්න අවශ්‍යය යි. මම පෞද්ගලිකව හිතන්නේ මෙන්න මේ කාරණා තේරුම් බේරුම් කරදීම අද බුද්ධිමතුන්ගේ එක් කාර්ය භාරයක් විය යුතුයි කියල.

අප අද ජනමාධ්‍ය විශ්ලේෂණය කළ හොත් අප රටේ දැනට අවුරුදු සීයකට වඩා පැරණි පුවත් පත් තියෙනව. ලෝකයේ ගුවන් විදුලිය ආරම්භ වෙලා අවුරුදු 5 ක් යන්නත් පෙර අපේ රටට ගුවන් විදුලිය ආවා. රූපවාහිනිය ප්‍රමාද වෙලා ආවත් ප්‍රාමාණික වශයෙන් රූපවාහිනිය වර්ධනය වෙලා තියෙනවා. සිනමාව අපට ප්‍රාමාණිකව පරක්කු වෙලා ආවත් යම් ප්‍රමාණයක අපේ රටේ ස්වභාවයට වර්ධනය වෙලා තියෙනවා. මා හිතන විදිහට මේ මගින් අපට, සමාජයට මෙහෙවරක්, වගකීමක්, සමාජයේ සංහිඳියාවක් ඇති කරන්නත්, සමාජයේ නොසන්සුන් බව වළක්වන්නත් පුළුවන් වී තියෙනවාද කියන කාරණය. දන් අද වන විට මම ගණන් කරල බැලුව පත්තර 16 කට වැඩිය තියෙනව. කෝටි දෙකයි මිනිස්සු ඉන්නෙ. කෝටි දෙකෙන් තුනෙන් එකක් පුංචි ළමයි.

කෝටියක් විතර තමයි සක්‍රීය මිනිස්සු ඉන්නෙ. ඒ කණ්ඩායමට පත්තර 16 ක් විතර තියෙනවා. රේඩියෝ චැනල්ස් 46 ක් විතර තියෙනවා. රූපවාහිනී චැනල්ස් 13 ක් 14 ක් විතර තියෙනවා. වෙබ් නාලිකා පැත්තකට දාන්න. මේක මහා ප්‍රවාහයක්. කවුද මේවා කියවන්නේ? අපි සමීක්ෂණ කරල බැලුවාම නම් අපට පේන්න නෑ මේ පත්තර කියවන මිනිස්සු කවුද කියල. පත්තර කියවන්නෙ කවු ද? බියගම නිදහස් වෙළඳ කලාපය කේන්ද්‍ර කරගත් සමීක්ෂණයේ දී පත්තර කියවන තරුණ ශ්‍රමිකයින් හමුවුණේ තුන් දෙනයි. ඒ ජාතික පත්තර කියවන අය.

මේ පත්තර ගහන්නෙ කවුද ? මේ පත්තර ගහන අය නිරීක්ෂණය කරල බලන්න. පුවත්පත් හිමිකාරීත්වය කොයි වගේ ද කියල. ප්‍රාග්ධන මූලයන්ගෙන් ද මේව වැටිල තියෙන්නෙ කියල. රූපවාහිනී ප්‍රාග්ධන මූලයන් කොහෙන්ද වැටිල තියෙන්නෙ කියල. සිනමා ප්‍රාග්ධන මූලයන් කොයි ආකාරයෙන් ද වැටිල තියෙන්නෙ කියල. මේවා මාධ්‍යයන්ගෙන් සාකච්ඡා වෙන්න ඕන කරුණු. මේවා අප බුද්ධිමතුන්, පර්යේෂකයින්, විද්වතුන් ලෙස සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු.

මම සතුටු වෙනවා ශ්‍රී පාලි මණ්ඩපයෙහි පර්යේෂණ ආයතනයක් බිහිවීම පිළිබඳව. මොකද මේ කරුණු හුදෙක් වාර්තාගත විය යුතුයි. හැඟීම්බරව නොවෙයි. දත්ත කරුණු මත විශ්ලේෂණය කරල ඉදිරිපත් කිරීම මගින් සමාජයේ දැනුවත් කිරීම් ඇති කළ හැකියි කියලයි මම හිතන්නෙ. උදාහරණයක් හැටියට අපේ දිවිනසා ගැනීම් පිළිබඳ ප්‍රශ්නය. අපි ශිෂ්‍යයොත් සමග සමීක්ෂණයක් කරල බැලුව. පොලිස් වාර්තා අනුව වැඩියෙන් ම දිවිනසා ගන්නා ගම, ග්‍රාමසේවා වසම පිළිබඳ අපි අධ්‍යයනය කළා. ඒ වසම සබරගමු පළාතේ තියෙන්නේ. නිරීක්ෂණය කළාම ඒ වර්ෂයෙහි දිවිනසා ගැනීම් 21ක් වාර්තා වෙලා තියෙනවා. ඒ සිදු වුණු 21 න් 19 ක් 20 ක් විතරම තරුණ තරුණියන්. මේ අයගේ දිවිනසා ගැනීමට බලපා තිබෙන කාරණා බොහෝම සරලයි. ප්‍රේමය බිඳ වැටීම, රස්සාවල් අහිමි වීම, වැඩිහිටියන් කරන අඩන්තේට්ටම්, යම් සමාජ මානසික ගැටලු වැනි පුංචි කාරණා. ඔවුන්ගේ සමාජ ආයතන විදිහට ගමේ තියෙන පන්සලට තිබුණු සමාජ ජනමත නායකත්වයේ කාර්යය භාරය කුමක් ද? ඒ ගමේ ඉන්න වැඩිහිටියන්ගේ සමාජ වගකීම මොකක්ද? සන්නිවේදනය කියන කාරණායේ දී පුවත්පත, ගුවන්විදුලිය, රූපවාහිනිය, සිනමාව තරම් ම අපේ සමාජයේ තිබුණු ජනමත නායකත්වයට මොකද වුණේ?

අපේ සමාජයේ ප්‍රතිඵල හා අගයන් නිර්මාණය කිරීමේ දී පුවත්පත කොයිවගේ කාර්යභාරයක් ඉටු කරල තියෙනව ද? පුවත්පතේ හැම වාර්තාවක්ම විශේෂයෙන් සිංහල හා දෙමළ පුවත්පත් වල දිවිනසා ගැනීම් අතිශය හැඟීම්බර, සංවේදනාත්මකව ලියල තියෙනව. ලෝකයේ දියුණු රටවල් මෙම කරුණ පිළිබඳ

ප්‍රමිතීන් ඇති කරගෙන තියෙනවා. පුවත්පත් කලාවේදීන් ප්‍රමිතීන් ඇති කරගෙන තියෙනව. විශේෂයෙන් ම ඉන්දියාවේ කේරළයේ. මට වඩා මේ පිළිබඳ අත්දැකීම් තියෙන්නේ ප්‍රනීත් අබේසුන්දර ඇතුළු ආචාර්යවරුන්ට. කේරළයේ මාධ්‍යවේදීන් තමන්ගේම සංවිධානයක් හදාගෙන ආචාර ධර්ම පද්ධතියක් හදාගත්තා. අද ආචාරධර්ම පද්ධතිය පිළිබඳ සංවාදය ගේනකොටම කැගහනවා. මොකටද මේ පාලනය කරන්නේ කියල ? ආචාරධර්ම කියන්නේ නීති නෙමෙයි. තහංචි ඉක්මවා ඊළඟට සමාජයේ ගොඩනැගෙන්නේ ආචාරධර්ම. ආචාරධර්ම ප්‍රමාණවත් නොවුණු විට තමයි නීති අවශ්‍ය වෙන්නෙ. මං හිතන්නේ මේ කථිකාවත් පිළිබඳ ගැඹුරින් සංවාද කරන්නට ආචාර්යවරුන්, බුද්ධිමතුන්, තරුණ පර්යේෂකයින්ගේ මැදිහත් වීම අවශ්‍ය යි. මේ පිළිබඳ දැනුවත් කිරීම් අවශ්‍යය යි. මේවා ප්‍රතිපත්තියක් දක්වා ගෙනයන්නට අවශ්‍යය යි. මේවා සැලසුම් කරුවන් දක්වා ගෙන යන්නට අවශ්‍යය යි. එසේ නොවන තාක් කල් මේවා සිහින විදිහට තියෙයි. අපේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට කොහොමද ආචාරධර්ම කියල දෙන්නේ ? හාමුදුරුවෝ ගිනි තියාගන්නවා. කැමරාව මාන ගෙන ඉන්නවා විනාඩි විස්සක් විතර. අර හාමුදුරුවන්ගේ අතේ තියන ලයිටරයට පයින් ගහන්න හිතුණෙත් උදුරගන්න හිතුණෙත් සාමාන්‍ය බැතිමතෙකුට. නමුත් මාධ්‍යවේදියාට සමාජ වගකීම තිබුණේ නෑ. ඔහුට ඕන කරල තිබුණෙ අපියි First, අපියි පළමුවෙනි, අපියි ඉක්මන් කියන ප්‍රවෘත්තිය හදන්න. මේ සමාජ වගකීමක් නැති මාධ්‍යවේදීන්. මේ පිළිබඳ සාකච්ඡා කරන්න අවශ්‍යය යි. මේ පිළිබඳ දැනුවත් කිරීම් අවශ්‍යය යි. මේ පිළිබඳ සංවාද කිරීම අවශ්‍යය යි. බුද්ධිමතුන් මේ ගැන සංවාද කිරීමත් හා පර්යේෂකයින් මෙවැනි දත්ත හා කරුණු විශ්ලේෂණය කිරීමත් අවශ්‍යය යි. එය අද තිබෙන ප්‍රධාන සමාජ වගකීමක් හා බුද්ධිමතුන්ගේ විෂය කාර්යභාරයක් බව මං විශ්වාස කරනවා.

බොහෝම ස්තුතියි.

# සිවි වන අදහස් දැක්වීම



**ආචාර්ය ටියුඩර් වීරසිංහ,**
**මණ්ඩපාධිපති,**
**ශ්‍රී පාලි මණ්ඩපය,**
**කොළඹ විශ්ව විද්‍යාලය.**

**ප්‍රශ්නය-**

**වර්තමාන දේශපාලන ක්‍රියාවලිය තුළ ජනමාධ්‍ය කියල කියන්නේ පාරේ යන එකක්, එහෙම නැත්නම් මෙය වර්තමාන දේශපාලන නායකයින්ගේ අතකොලුවක්, ආයුධයක් පමණක්ම ද? එහෙම නැත්නම් මේ ජනමත නායකත්වය විනාශ කරල ජනතාව අයාලේ අරගෙන යන එක්තරා සංවිධානයක් ද?**

**පිළිතුර-**

ඇත්ත වශයෙන්ම මහාචාර්යවරුන් දෙපලම අදහස් දැක්වූවා ප්‍රවේශයක් විදිහට. ඒ වගේම ප්‍රනීත් අබේසුන්දර මහතාත් මේ පිළිබඳ අදහස් දැක්වූවා. එහිදී සමකාලීන මාධ්‍යයේ භූමිකාව සම්බන්ධයෙන් යම් පෙළඹවීමක් සිද්ධ වුණා.

ඇත්ත වශයෙන්ම මේ මාධ්‍ය කියන සංකල්පය එහෙම නැත්නම් Mass Media කියන එක යම් කිසි ආකාරයක සමාජයට බලපෑමක් කරන මාධ්‍යයක් බවට පත් වුණේ ගොඩක් ඈත කාලයක ඉඳලම නොවෙයි. අපි බැලුවොත් 17 වන ශතවර්ෂය පටන් තමයි Mass Media, එහෙම නැත්නම් අපි කියන ජනමාධ්‍ය බිහි වෙන්නේ. බිහිවෙලා 20 වන ශතවර්ෂය වෙනකොට විද්‍යුත් මාධ්‍යයන් බිහිවෙලා, පද්ධතියක් බවට පත් වෙලා,

ඊට පස්සේ මේක සමාජයේ ක්‍රියාත්මක වෙනවා. මෙම මාධ්‍ය

බිහිවීමට පදනම් වූ සමාජ පසුබිම දැනගැනීමත් අතිශය වැදගත්. එදා පැවතුණේ ධනවාදී සමාජයක්. මේ ධනවාදී සමාජයේ තමයි මාධ්‍ය බිහි වන්නේ. එතකොට මේ ධනවාදී සමාජයේ බිහිවුණු මාධ්‍යයට අනිවාර්යයෙන් ම ඒ සමාජයේ ගති ලක්ෂණ ආරෝපණය වෙනව. ඒක වලක්වන්න කාටවත්ම බැහැ. ඒක ඒ විදිහටම සිද්ධ වුණා. ඒ නිසා බොහෝම කෙටි කාලයක් ඇතුළත දී මාධ්‍ය විශාල Monopoly එකක්, එහෙම නැත්නම් ඒකාධිකාරී සමාගම් දක්වා වර්ධනය වෙන්න පටන් ගත්තා. පුවත්පත් දහස් ගණනක් පමණ ප්‍රකාශ කරල එක සමාගමක් බිහිවෙනවා. ඊළඟට ගුවන්විදුලි සමාගම්, නාලිකා බිහි වෙනවා. රූපවාහිනී සමාගම්, නාලිකා බිහි වෙනවා. සමාජයේ ඒවා බිහි වීමත් සමගම විශාල ලෙස මාධ්‍ය සමාජයට බලපෑම් කරන්නට පටන් ගත්තා. ඒ කියන්නේ සමාජයේ පුද්ගලික ජීවිත මිනිසුන්ගේ දේශපාලන ජීවිතයට, සංස්කෘතික ජීවිතයට, ඒ වගේම ආර්ථික ක්‍රියාකාරකම් වලට පවා විශාල බලපෑමක් කරන්න පටන් ගත්තා. ඒ නිසා 1920 වර්ෂය ආරම්භයේ දී බොහෝ යුරෝපීය රටවල් වල අවධානය මේ ගැන යොමු කරනවා .

පසු ගිය දවස් වල හාමුදුරුවන්ගේ ගිනි තබා ගැනීමත් සමගම ජනමාධ්‍ය ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීම පිළිබඳ අදහස මතු වෙනව. යුරෝපීය මාධ්‍ය තුළ මෙම ආචාර ධර්ම පිළිබඳ ගැටලුව මතු වන්නේ මීට අවුරුදු එකසිය ගණනකට කලින්. ඒ යුරෝපීය රටවල් ඇතුලේ. ඒ කියන්නේ 20 වන ශතවර්ෂයේ මුල. මම හිතන්නේ 1900 දී විතර තමයි මෙය ඇති වෙන්නේ. ඒ රටවල් මාධ්‍ය තමන්ට කරන ලද බලපෑම් නිසා යම් යම් දේවල් ගොඩ නගා ගන්තා. යම් යම් මාධ්‍යකරුවන්ගේ ක්‍රියාකාරකම්, මාධ්‍ය ප්‍රධානීන්ගේ ක්‍රියාකාරකම්, රජය හා සමාජය අතර සම්බන්ධය කොහොමද ආදී වශයෙන්. ආචාරධර්ම කියන්නේ නීතියක් නෙවෙයි. ඇත්තටම පන්සිල් පද පහ වගේ තමයි. ඒක කඩ කරන්නත් පුලුවන්. ඕන නම් පිලිපදින්නත් පුලුවන්. ඊට පස්සෙ 1920 ගණන් වෙන කොට 20 වන ශතවර්ෂයේ මේ ආචාරධර්ම පද්ධතිය ගෝලීය වශයෙන් සාකච්ඡා කරන්න පටන් ගන්නවා. ජාතික වශයෙන් නොවෙයි ජාත්‍යන්තර ආචාර ධර්ම පද්ධතීන් නිර්මාණය කිරීමේ අවධියකට එනවා. ඒ මාධ්‍ය ඒකාධිකාරය ගෝලීය පරිපාලනයට ලෝකය එක්

කිරීම නිසා. නමුත් ඒක එච්චර සාර්ථක වුණේ නෑ. ඒක අසාර්ථක වුණා. ඒ නිසා ඊට පසුව  මාධ්‍ය නියාමනය කිරීම සඳහා යොමු වෙනවා.

එසේම ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය ආදී ක්‍රියාමාර්ග ඔස්සේ නෛතික පද්ධතියක් ගොඩනගනවා. එයින් කියන්නේ මොකක් ද? සමාජයට මාධ්‍ය කියන ආයතනය  ප්‍රබල බලපෑමක් කරන නිසා එය නියාමනය කළ යුතුයි කියන තර්කය. මුලින්ම ආචාර ධර්මීය රාමුව තුළ මෙය නිර්මාණය කරනවා.  ඊට පස්සෙ නෛතික රාමුව තුළ. නමුත් එහි එච්චර සාර්ථක බවක් පේන්නෙ නෑ. නමුත් යම් යම් සාධනීය මට්ටම් තියෙනවා. ඊළඟට දෙවන ලෝක යුද්ධයෙන් පස්සෙ ඒ කියන්නෙ 1950 ගණන් වලින් පස්සෙත් ඇත්ත වශයෙන් ම විද්‍යුත් මාධ්‍ය, පුවත්පත් වැනි සන්නිවේදන මාධ්‍යයන්ගේ තාක්ෂණය තුළ සුවිශාල වර්ධනයක් ඇති වෙනව. ඒ විදිහට මේක තවත් ප්‍රබල ආයතනයක් බවට පත් වෙනව. සමහර වෙලාවට රටවල් වල දේශපාලන පරිසරය පවා පරිවර්තනය කිරීමට, පෙරලීමට මාධ්‍ය ප්‍රබල වෙලා තියෙනව. මාධ්‍යට විරුදාවලියක් පවා පසුව පට බැඳෙනව සිව්වෙනි ආණ්ඩුව කියල. ඒ මාධ්‍ය කරන බලපෑම නිසා.

විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය ඊට අමතරව ප්‍රජාතන්ත්‍රවාදයටත්, ජනමාධ්‍යයටත් විශාල බලයක් තියෙනවා. ඊට පස්සෙ නැවතත් ආචාර ධර්ම හා නීති වලට අවධානය යොමු වෙනව. නමුත් ඒවාට එතරම්ම අවධානය යොමු වන්නේ නෑ. ඊළඟ රැල්ල පටන් ගන්නේ ආචාර ධර්ම හා මාධ්‍ය සමාජයට කරන බලපෑම පිළිබඳව. 70 දශකයේ සිට අද දකින නව මාධ්‍ය කරලියට එන්න පටන් ගන්නව. ඒවා  නියාමනය කිරීම සඳහා යම් යම් ආකාරයේ දේවල් ඉදිරිපත් කරන්න උත්සාහ කරනවා. අදත් ඒ කථිකාව එහෙම්ම ම යනවා. 90 දශකයේත් ඒ කතිකාව පටන් ගත්තා.

අපේ රටේ මේ වෙනකොට අන්තර්ජාලය ප්‍රබල වෙලා තියෙනව. ඇත්ත වශයෙන්ම පුවත්පත් වල යම් යම් ආකාරයේ නියාමනයන් සම්පාදනය වී තිබුණත් විද්‍යුත් මාධ්‍ය තුළ සක්‍රීය විදිහට පොදු පිළිගැනීමකින් එය නැහැ.  ඒ නිසා ඒවත් නියාමනය කරන්න දූන්

පසුගිය දවස් වල ජනමාධ්‍ය අමාත්‍යංශයේ මූලිකත්වයෙන් ආචාර ධර්ම පද්ධතියක් ගෙනාව. ඒ පිළිබඳ සමාජයේ විවිධ ප්‍රතිචාර එළි දැක්වුණා. ඊට විරුද්ධව අදහස් දක්වන අය ඉන්නවා. යම් කිසි සැඟවිච්ච න්‍යාය පත්‍රයක් තියෙන්න පුලුවන් මාධ්‍ය පාලනය කරන්න. මාධ්‍ය මර්දනය කරන්න. ඒ ඔස්සේ සමාජ ක්‍රියාවලිය හසුරුවන්න. මේ කියන අදහසත් තියෙනවා. ඒ වගේම අනෙක් පැත්තෙන් ඒක ඉදිරිපත් කරන්නෙ මාධ්‍යයෙන්ම යි. අද විශාල විදිහට මේක සමාජ යතාර්ථවාදීවත්, ආචාර ධර්මීයව සහ සදාචාරමය ලෙසත්, මිනිසුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන පරිදි කෙරෙන විශාල බලපෑමක් නිසාත්, මාධ්‍යයට යම්කිසි නියාමන පද්ධතියක්, එහෙම නැත්නම් ආචාර ධර්ම පද්ධතියක් ගේන්න ඕන කියන පණිවුඩය කෙටියෙන් දැනුම් දෙන්න ඕන.

නමුත් මගේ අදහස ඒකට වඩා ටිකක් වෙනස්. සභාවෙන් ආ අදහස් සමඟ මට මාතෘකාව ලැබුණෙ සමාජ, දේශපාලන, ආර්ථික ක්‍රියාවලිය තුළ මාධ්‍යයේ භූමිකාව. ඇත්ත වශයෙන්ම ඒ තුළ මාධ්‍යයේ භූමිකාවට වඩා සමාජ දේශපාලන ක්‍රියාවලියේම කොටසක් ලෙස තමයි මාධ්‍යය තියෙන්නේ. විශේෂ භූමිකාවක් කියල සඳහන් කරන්න අපහසුයි. මාධ්‍යය භූමිකාවකුත් තියෙනව. නමුත් මාධ්‍යය සමාජ දේශපාලන ක්‍රියාවලියේම කොටසක් බව අමතක නොකල යුතු යි. එයයි පළවෙනි කාරණය.

දෙවෙනි කාරණය මානව සංහතිය සමාජයේ පරිණාමයත් එක්කම මිනිසාව පාලනය කරන විඥාපන මාධ්‍යයක් බවට මාධ්‍ය පත් වීම. ඒ කියන්නේ Mass Media විවිධ මාධ්‍යයන්ගේ බලපෑම සහ ඒවායේ ආධිපත්‍යය වැඩි වෙන බව. මේ සමස්ත මාධ්‍ය පද්ධතියම සමාජ ක්‍රියාවලීන් සමඟ යම්කිසි ආකාරයක කල් ඇතිවම සැලසුම් කරල, කල් ඇතිවම ඒවා යම්කිසි තැනකට අරමුණු සහගතව ගෙනි යන්න පුලුවන්. උදාහරණයක් ලෙස ටියුනීසියාවේ ඇති වෙච්ච ප්‍රශ්නය සැලකිය හැකි යි. අරාබි වසන්තය දැන් ඇවිල්ල තියෙනව. එක සිරියාව, ඊළඟට ඉරානය ආදී වශයෙන්. මේක අහම්බෙන් වෙච්ච දෙයක් නෙමෙයි. මෙතන ප්‍රබල ජාත්‍යන්තර සංහතික දේශපාලන ක්‍රියාවලිය තුළ Mass Media ප්‍රබල භූමිකාවක් රඟ දක්වනවා. නැත්නම් මේ ජාත්‍යන්තර මාධ්‍ය, ගෝලීය මාධ්‍ය

සමාජ ක්‍රියාවලීන් නිර්මාණය කරනවා පවතින දේ වලින්. අපි මේ සම්භාව්‍ය මාධ්‍ය කියල වර්මානයේ කියන්නේ ඔය තියෙන දේවල් වාර්තා කරන මාධ්‍යයට. ඉදිරිපත් කිරීමට වාර්තා කිරීම තමයි වැඩිපුරම කරන්නේ. ඒක යල් පැනගිය අදහසක්.

ඇත්ත වශයෙන්ම දැන් සමාජ ක්‍රියාවලීන් බොහෝ දේවල් නිර්මාණය කරනවා. ඒවාට අධිපති පංතියේ වුවමනාවන් සහ අවශ්‍යතා වලට අනුව හැසිරවීමේ හැකියාව ලැබිල තියෙනවා. මාධ්‍ය පරිහරණය, පාවිච්චි කිරීම ආදී කාරණා කිහිපයක් එයට බලපෑවා. මේ සමාජ දේශපාලන ක්‍රියාවලිය එක් කාරණයක්. දේශපාලන ක්‍රියාවලිය මුවහත් කිරීම සහ එය ශීඝ්‍ර කිරීම හා යම් කිසි ත්වරණයකින් එය ඉදිරියට තල්ලු කිරීමට සමකාලීන මාධ්‍ය උත්සාහ ගන්නවා. ඒ මාධ්‍යයේ තියෙන තර්කනය. මාධ්‍යය හැසිරෙන ආකාරයට බලපෑම බාහිරින් තියෙන්නේ. දැන් 1950 ඇමරිකානු ජනාධිපතිවරණය රූපවාහිනිය වාර්තා කරනවා. දැන් එහෙම නෙවෙයි. ඒක දිගින් දිගටම නියාමනය කරනවා. දැන් සමාජ, දේශපාලන ක්‍රියාවලිය එක් පැත්තකටත්, මාධ්‍ය ක්‍රියාවලිය තවත් පසෙකටත් ගලා යනවා. දැන් මාධ්‍ය ක්‍රියාවලියේ තර්කනය, දේශපාලන ක්‍රියාවලියේ තර්කනයට සමපාත වෙලා තියෙන්නේ. එහෙම නැත්නම් දෙකම එකක් බවට පත් වෙලා තියෙන්නේ. මේක හඳුන ගන්න අමාරුයි. එක වෙලාවකට දේශපාලන ක්‍රියාවලියෙන් පටන් ගන්නේ. තව වෙලාවකට මාධ්‍ය ක්‍රියාවලියෙන් පටන් ගන්නේ. දැන් ලංකාවේ මාධ්‍ය ක්‍රියාවලිය දිහා බැලුවාම හොඳටම තේරුම් ගත හැකියි මේ කාරණය. ඒක බොහෝම සංකීර්ණ කාරණයක්.

තුන්වෙනි කාරණය; ජනමාධ්‍ය කියන වචනය වැරදියි කියල මම නිතරම කියනව. ඒ නිසා මගේ මේ අදහස් පැහැදිලි කරන්න පාවිච්චි කරන්නෙ Mass Media එහෙම නැත්නම් සංහතික මාධ්‍යය කියන එකයි. ජනමාධ්‍ය කියල කියන්නේ ඉස්සර අර ප්‍රාථමික සමාජ වල, මධ්‍යතන සමාජ වල ජන ගී, ජන කවි ආදී ඒවා. මේ Mass කියන සංකල්පය එන්නෙ 17 වන සියවසෙන් පස්සෙ. කාර්මික විප්ලවයෙන් පසු කාලීනව. ඒක සමාජය තුළ දේශපාලන ක්‍රියාවලිය හා රාජ්‍යකරණ ක්‍රියාවලියේ කොටසක් ලෙසයි පහළ වෙන්නෙ. ඇත්ත වශයෙන්ම මේ Mass කියන සංකල්පය, මෙය

අර්ථ කථනය කරනව පසුව ජන විඥාපන, එහෙම නැත්නම් ජන මාධ්‍ය, ජන සන්නිවේදනය කියන වචන වලින්. එතකොට මේ Mass කියන වචනය තිබුණෙ නැහැ අපේ භාෂාවේ. ඒක නිසා මොකද වුණේ ? මේකට දැම්මා ජන කියන වචනය. එතකොට Mass Communication ජන සන්නිවේදනය වුණා. Mass Media ජනමාධ්‍ය වුණා. ඊළඟට වැදගත්ම ප්‍රතිවිරෝදය තමයි තව අලුත් වචනයක් බිහි වීම. එතකොට Mass Culture කියන එක ලංකාවට එන්නෙ ජන සංස්කෘතිය කියල නෙමෙයි. ඒක එන්නෙ බහුජන සංස්කෘතිය කියල. එතකොට බහුජන කියල කොටසකුත් භාවිතා කරල තියෙනව. දැන් මේ ඔක්කොම අව්වාරුවක් බවට පත් වෙලා. ක්‍රියාවලීන් දෙකක් අර්ථ කථනය කරන්නේ එකම වචනයෙන් සහ එකම ක්‍රියාවලියක් අර්ථ කථනය කරන්න වචන දෙකක්. ඇත්ත වශයෙන්ම හරි අවුලක්. මෙහි සංකල්පීය ප්‍රශ්නයක් තියෙනව.

ලංකාවේ එල්. ටී. ඊ. සංවිධානය විනාශ වීමත් සමඟම ලංකාවේ අලුත් යුගයක් උදා වුණා. ඒ අලුත් යුගය කියල කියන්නේ මේ කියන ආණ්ඩුව කියන අලුත් යුගයක් නොවෙයි ඇත්ත වශයෙන්ම. වෙනම අලුත් යුගයක් උදා වුණා. ඒ යුගය තමයි සමස්ථ සමාජයම සංහතික කරණය වෙන්න පටන් ගත්ත යුගය. ඒ කියන්නෙ Massification. කලින් තිබුණු නීතිය Public Opinion කියන එක, ඒ කියන්නෙ ජන මතය දැන් Mass Opinion බවට පත් වෙලා. අද Mass Opinion එකට අනුව තමයි Politicians ලා කටයුතු කරන්නේ. සංහතික මාධ්‍ය අනිවාර්යයෙන්ම එතන තියෙන්න ඕනැ. කලින් හිටියෙ අර ප්‍රාදේශීය ජනමත කට්ටිය. ඒ Public Opinion එක කලින් තිබුණු එකක්. දැන් එහෙම එකක් නෑ අපේ සමාජයේ. දැන් Public Opinion නැහැ. මොකක්ද Public Opinion කියල කියන්නේ ? මිනිසුන්ගේ අවශ්‍යතාවයන් ඔවුන්ගේ වුවමනාවන් ක්‍රමානුකූලව බිම් මට්ටමේ සිට ඉහළට මාධ්‍ය ඔස්සේ ගෙන යාම. ඒක තමයි Mass Opinion කියන්නෙ. අද එහෙම එකක් වෙන්නෙ නෑ . අද ඉහළ තියෙන මතයක් මේ සංහතිකයන්ට එහෙම නැත්නම් Masses ලාට උඩින් ප්‍රබල සංහතික මාධ්‍ය භාවිතා කරගෙන ඔවුනට එය ආරෝපණය කරනවා . ඊළඟට ඒගොල්ලන් මෙයට අනුගත වෙනව. ඒකට අපි කියනව Mass Ideology කියල.

අපේ පශ්චාත් යුධ දේශපාලන සන්දර්භය තුළ පසුගිය අවුරුදු හතර තුළ සමාජයීය වශයෙන් ඉතාමත් තීරණාත්මක ලක්ෂණයකට ඇවිල්ල තියෙනව . දැන් සමස්ත සමාජයේම කේන්ද්‍රය වූ නීතියේ ආධිපත්‍යය බිඳ වැටිල. සදාචාර ආධිපත්‍යය සම්පූර්ණයෙන් බිඳ වැටිල. පළාත් සභා මන්ත්‍රීවරයෙකුට පුලුවන් ගුරුවරයෙක් දණ ගස්වන්න. ඒක සාමාන්‍ය පුද්ගලයෙකුට ඔලුවට එන කාරණයක් නොවෙයි ඇත්තටම. ඒ වගේ ඒව වෙන්න පුලුවන් ද කියන එක ගැටලුවක්. ඒක වෙන්න පුලුවන් මේ සන්දර්භය තුළ විතරයි. ඒක හින්ද ඒක අහඹු සිදු වීමක් නෙවෙයි ඇත්ත වශයෙන්ම. මේ සමකාලීන සමාජ දේශපාලන ක්‍රියාවලියේම සංයුක්ත, බේදනීය සිද්ධියක්. සිද්ධියට පත් වෙච්ච දීර්ඝ කාලීන ව්‍යුහය කොහෙද කියල අපි හොයන්න ඕන. ඒ ඔස්සේ විශ්ලේෂණය කළ විට තේරෙනව මේ Mass Media කියන සංහතික මාධ්‍ය සමකාලීන සමාජ, දේශපාලන, සංස්කෘතික ක්‍රියාවලියත් එක්ක කොච්චර සම්බන්ධ වෙලා තියෙනවද කියල.

කෙටියෙන්ම කියනව නම් මේ කියපු දේ සාරාංශ කළොත් අද මානව සංහතිය සමාජ පරිණාමය තුළ තීරණාත්මක ලක්ෂයකට පරිවර්තනය වෙලා තියෙනව. සමාජය සහ ඉතිහාසය සැලසුම් කරල, තමන්ට ඕන විදිහට හැසිරවීමේ සම්පූර්ණ ශක්තිය ආධිපත්‍යය දරන පාලක පංතියට හිමි වෙලා තියෙනව. ඒකෙන් අදහස් වෙන්නෙ නැහැ. ඔවුන්ට අවශ්‍ය විදිහට කරන්න පුලුවන් කියල. එතන තියෙනව නියමයක්. ඒක තමයි මගේ තියෙන මූලික අදහස සමකාලීන මාධ්‍ය හා දේශපාලන ක්‍රියාවලිය පිළිබඳව.

ස්තුතියි.

# පස් වන අදහස් දැක්වීම



**ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන,**
**බාහිර කථිකාචාර්ය,**
**ප්‍රාසාංගික කලා අධ්‍යයන අංශය,**
**ශ්‍රී පාලි මණ්ඩපය,**
**කොළඹ විශ්වවිද්‍යාලය.**

**ප්‍රශ්නය :-**

**වර්තමානයේ මාධ්‍යවේදීන්ගේ භාෂා භාවිතය, විශේෂයෙන්ම සිංහල භාෂාව භාවිතා කිරීමේ දී පොදු සම්මත වලට අනුකූලව වගකීමකින් ද එය සිදු කරන්නේ. එසේ නොමැති නම් ඒ සඳහා ගත යුතු පියවර කුමක් ද?**

**පිළිතුර :-**

මං කැමති යම්කිසි ප්‍රතිචාරයක් දක්වන්න. නමුත් ඊට කලින් සාකච්ඡා වූ වැදගත් මාතෘකා සම්බන්ධයෙන් මට ඉඩක් ලැබුණා නම් මං කැමති අදහසක් දක්වන්න. මේ ඉස්සෙල්ලම ප්‍රශ්නය වැදගත් ප්‍රශ්නයක් නිසා මං කැමති යමක් කියන්න. ඔබ අදහස් කරන්නේ මාධ්‍යකරුවා පාවිච්චි කරන භාෂාව ගැන වෙන්න ඕන. නේද?

මම දකින ප්‍රශ්න දෙකක් තියෙනවා. මම දන්නෙ නැහැ ඒක ඔය මේ ගැන තියෙන විවේචන වලට අදාළ ප්‍රශ්නද කියල. මාධ්‍ය භාෂාව විවේචනය කරනවා. බොහෝ වෙලාවට සිංහල විද්වතුන් විවේචනය කරන ආකාරයක් තියෙනවා. ඒ විවේචන අනුව මූලික වශයෙන් භාෂාව සංකර වෙනවා, භාෂාව කිලුටු වෙනවා, සම්ප්‍රදායට නොගැලපේ ආදී වශයෙන්. මමත් විවේචනයක් කරනවා. ඊට වඩා වෙනස් ආකාරයක විවේචනයක තමයි මම ඉන්නෙ. මම හිතනවා ඊට වඩා ප්‍රශ්නය ගැඹුරු විදිහට. අපි විශේෂයෙන් දකිනව

වර්තමානයේ ජනමාධ්‍ය පාවිච්චි කරන භාෂාව. අපිට ඕනනම් ඒක තේරුම් ගන්න විශේෂයෙන්ම FM Station වල භාෂාව සලකල බලන්න පුලුවන්. මුද්‍රිත මාධ්‍ය වුණත් පුලුවන්. ප්‍රධාන ප්‍රශ්න දෙකක් මම දකිනවා. මේ භාෂාව තමයි නැත්නම් භාෂාවට සාපේක්ෂව තමයි අපේ විඥානය ගොඩනැගෙන්නේ. භාෂාව කොච්චරද අපි එච්චරයි. සරලවම භාෂාව කොච්චර දියුණු ද? කොච්චර සංකීර්ණ ද? ඒ තරමට අපේ විඥානය සංකීර්ණයි. සංවර්ධිතයි. භාෂාවට සාපේක්ෂයි. භාෂාවට කොච්චර අපේ ජීවිතය ස්පර්ශ කරන්න පුලුවන් ද? ඒ තාක් දුරට භාෂාවේ තියෙන ශක්‍යතාවය තමයි අපේ විඥානයේ ශක්‍යතාවය. ඉතිං ඒක ඉතා ගැඹුරු අදහසක්. නමුත් මේක දැනගන්න ඕන නම් ඔබට පුලුවන් FM Station එකක් එකක Channel එකක් සුසර කරල උදේ සිට හවස් වනතෙක් කතාකරන භාෂාවේ වචන කීයක් තියෙනවද කියල ගණන් කරන්න. බොහෝ දේවල් වලට කතා කරන වචන, ඉදිරිපත් කරන වචන බැලුවහොත් ඔබට තේරේවි මේකේ වචන 50 ක් 60 වැනි ඉතාම සීමිත වාග් කෝෂයක් තිබෙන බව. ඉතා වැදගත් මනුෂ්‍ය සංසිද්ධීන් පිළිබඳ ඉතාම සරලම අර්ථයකින් තමයි කතා කරන්නේ. ඊට වඩා දුර යන්න බැහැ අර්ථයෙන්. ඒ වගේ සරලම වාග් කෝෂයක් තමයි තියෙන්නේ.

මේ නිසා භාෂාව හීන වෙන්න පටන් ගන්නවා. දුප්පත් වෙන්න පටන් ගන්නවා. ඒ වාග් කෝෂය තුළ හිර වෙන්න පටන් ගන්නවා. එතකොට පළවෙනි වැඩේ තමයි භාෂා දුප්පත් වීම නිසා විඥානය සංකෝචනය වෙන්න පටන් ගන්නවා. විචාරාත්මක වශයෙන් කල්පනා කරන්න තියෙන ශක්තිය හීන වෙන්න පටන් ගන්නවා. මේක තමයි හඳාගන්න පළමුවෙනි භයානක ප්‍රශ්නය.

වෙනත් අතකින් කිව්වොත් භාෂාව මොන විදිහකින් හෝ ව්‍යක්ත වෙන්න ඕන. දැන් ඔය සංකර වීම පිළිබඳ ප්‍රශ්නය වෙනම කතා කරනව. දැන් අපේ සිංහල භාෂාව ගත්හොත් ඊයෙ පෙරේදා ප්‍රයෝජනවත් වැඩක් කරල තිබුණා ආචාර්ය සඳගෝමි කෝපරහේවා. ඊට කලින් ඕනනම් අපි සිංහල භාෂාවේ සංවර්ධනය ගැන බැලුවොත් අතිවිශාල වචන ප්‍රමාණයක් තියෙනව දෙමළෙන් ආපු. දැන් ඉතිං වෙන භාෂාවකින් ගත්ත දේ අපි කොහොමද

දකින්නේ? ඒක සංකර වීමක් නම් හරි ප්‍රශ්නයක්නේ. දැන් හෙළ උරුම කියල කට්ටියක් ඉන්නවා. ඒගොල්ලො හෙළය ගැන කල්පනා කරනව. උරුමය කියන වචනෙ දෙමළ වචනයක්. අන්න ඒ වගේ. විහිලු තත්ත්වයක් තියෙන්නේ. එතකොට අපේ භාෂාව පොහොසත් වෙලා තියෙනවා කලාපීය භාෂා එක්ක අපි කරපු ඉතා වැදගත් ගනු දෙනුව නිසා. වෙන ක්‍රමයකුත් නෑ භාෂාවක් පෝෂණය වෙන්න.

එතකොට අපේ මේ භාෂා වාහකය ගැන අපි ගොඩාක් ආඩම්බර වෙනවා. උදාහරණයක් විදිහට ගත්තොත් කෝට්ටේ යුගයේ රාහුල හාමුදුරුවෝ ෂඩ් භාෂා පරමේශ්වර නමින් හැඳින්වූවා. ඒකේ තේරුම මොකක්ද ? සිංහල භාෂාවෙන් වැඩකරපු වාහකයා නැත්නම් භාෂාව ගෙනියපු සාහිත්‍යධරයාට තවත් භාෂා හයකට අත දාන්න පුළුවන්. ඒ නිසා මේ සිංහල භාෂාව පෝසත් වෙන්න පටන් ගත්තා. අනෙකුත් භාෂා සම්ප්‍රදායන්ට ඇතුල් වෙන්න පුලුවන් වුණ නිසා. ඒක තමයි භාෂාව දියුණු වූ ක්‍රමය. වෙන ක්‍රමයක් නෑ. මේ ගනු දෙනුව තුළින් තමයි භාෂාව දියුණු වෙන්නෙ. අනෙකුත් භාෂා ස්පර්ශ වීම නෙමෙයි. ප්‍රශ්නේ තියෙන්නේ අපි කොච්චර ව්‍යක්ත භාවයක් ඒ කියන්නේ ශක්තියකින් භාෂාව අත්පත් කර ගන්නවද කියන එක. දැන් තියෙන ප්‍රශ්නය තමයි ජනමාධ්‍ය භාෂාව දුප්පත් වීම. ඒක තමා පළවෙනි ප්‍රශ්නය. දෙවෙනි ප්‍රශ්නය අපේ විද්‍යාර්ථයින් දන්නවා කථිකාමය ප්‍රශ්නය. භාෂාව කියන්නේ Neutral දෙයක් නෙමෙයි. අහිංසක දෙයක් නෙමෙයි. භාෂාව අපේ ජීවිතය ගොඩනගන ආකාරය භාෂාව විසින් අපේ ජීවිතයේ සම්බන්ධතා ද, මනුෂ්‍ය ජීවිතයට අදාළ නිර්ණායක ද ගොඩ නගනවා.

එතකොට ඒ භාෂාවේ පාවිච්චි කරන වචන, වාග් විලාසය, යෙදුම් විසින් අපි ලෝකයත් එක්ක සම්බන්ධ කරනවා. තව උදාහරණයක් කියනවා නම් මගේ සිසුවියක් විශ්ව විද්‍යාලයේ උප සංස්කෘතික භාෂාව පිළිබඳ කථිකාමය විමර්ශනයක් කියල අධ්‍යයනයක් කරනවා. මොකක්ද මේ කතිකාමය විමර්ශනයක් කියන්නේ ? ඒක වැදගත්.

ජන මාධ්‍යයේ News Reading බැලුවම අපට ගැටලු සහගතයි. මේ භාෂාව ගැටලු සහගත වන්නේ මෙන්න මේ අර්ථයෙන්.

උදාහරණයන්ට ගියොත් "මුස්ලිම්කරු කුඩු සමග හසු වේ". මේ වගේ දෙවල් වලින් ජනමාධ්‍ය පිරිලා. "රූමතිය ගඟට පැන දිවි නසා ගනී" මෙන්න මේ කතන්දරය පිටිපස්සේ අපි ලෝකය දිහා බලන ආකාරය, සම්බන්ධ වන ආකාරයක් මේ තියෙන්නේ. අපි කියන්නෙ නැහැ සිංහල තරුණයා කුඩු සමග හසු වේ කියල. එහෙම කියලා වැඩකුත් නැහැනේ. දැන් මුස්ලිම් මේ අනන්‍යතාවය ප්‍රශ්නයක් ලෙසටයි දකින්නේ. ඒක එයාට සම්බන්ධ කරලා කියනවා. ඒක ගැටුම්කාරී භාෂාවක්. මේක එක සමාජයක් ගර්භාවට පත් වන භාෂාවක්. රූමතිය ගඟට බැස දිවිනසා ගනී. මේ මනුෂ්‍යයෙක් ගඟට පැනල මැරිලා. මේක බේදවාචකයක්. ඒකනෙ Report කරන්න ඕන දේ. නමුත් කියන්නේ රූමතිය ගඟට පැන දිවිනසා ගනී. එතකොට ඒක කාට ද කියන්නේ ? මේක එතකොට පිරිමින්ට ආකර්ශනීය පුවතක්. ඒවා භයානක වැඩ. අන්න ඒවගේ ඒවා වලින් අපේ දෛනික ජනමාධ්‍ය පිරිලා. ඒක තමයි මම දකින භාෂාවේ දෙවනි ගැටලුව. ඒ කියන්නේ භාෂාව පිළිබඳව කතිකාමය සංවේදීතාවයක් අපට නෑ. ඒ කියන්නේ මනුෂයත්වය පිළිබඳ හැඟීමක් අපට නෑ. ඒ දෙක තමයි මම දකින ප්‍රශ්න, වෙන ප්‍රශ්න නෙමෙයි ජනමාධ්‍යයේ භාෂාව සම්බන්ධයෙන්.

බොහොම ස්තුතියි.

# සය වන අදහස් දැක්වීම



**ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන,**
**බාහිර කථිකාචාර්ය,**
**ප්‍රාසාංගික කලා අධ්‍යයන අංශය,**
**ශ්‍රී පාලි මණ්ඩපය,**
**කොළඹ විශ්වවිද්‍යාලය.**

**ප්‍රශ්නය:-**

**වර්තමානයේ සමස්ත සමාජයම නිර්වින්දනය වෙලා. අපි කොතරම් කටයුතු කළත් එයින් මුදව ගන්න, මිනිසුන් එයින් එළියට එන්නෙ නැහැ. එතනින් එහාට ගිහින් ජනමාධ්‍ය පිළිබඳ කතා කළොත් මහජනයාගේ මතය නියෝජනය කරන මාධ්‍යයක් ද බිහිවිය යුතු යි. නමුත් අද සිදු වන්නේ කුමක් ද? මහජන මතයත් සමග ජනමාධ්‍ය අද වන විට ක්‍රියාකාරී වී ඇත්තේ කොහොමද?**

**පිළිතුර:-**

ආචාර්ය ටියුඩර් වීරසිංහ මේ ප්‍රශ්නයට ප්‍රවේශයක් ලබා දුන්නා. අපි එතැන් සිට මේ පිළිබඳ අවධානය යොමු කිරීමට අවශ්‍යය යි. සංහතික ජනමාධ්‍ය අද සංහතික මාධ්‍ය කියල අදහස් කරනවා. ඒ වගේම ආචාර්යතුමා කතා කළා ජනමතය සකස් වීමේ ක්‍රියාවලිය පිළිබඳ. කොච්චර දුරට ඔබට ඒක අහුවෙනව ද? මේ ජනමාධ්‍ය වෙන් කොට ගන්න බෑ. ඒක සමාජ සංස්කෘතික ක්‍රියාවලියේ කොටසක්. ඒක පිළිබඳ ඊටත් වඩා බරපතලව දාර්ශනිකව කියන්න පුළුවන්. මෙහි දී පාවිච්චි කරන්න වෙන සංකල්පය තමයි System කියන එක. නැත්නම් පද්ධති න්‍යාය ඇසුරින් ඒක තේරුම් ගන්න ඕන. ඒක ටිකක් මේ වගේ දෙයක්. මොකක්ද, නූතන යුගයේ ආරම්භක කාලයේ දී අප ලෝකය දකින්න පටන් ගත්තේ කෑලි කෑලි විදිහට.

යාන්ත්‍රික ආකල්පයක් ලෙස. ඒක අද දක්වා අප පස්සේ එනවා. ඒකෙන් අපේ චින්තනය මිදිල නැහැ . නූතන චින්තනය මිදිල නෑ. නමුත් ලෝකය ඇත්ත වශයෙන්ම එහෙම නෑ. ලෝකය තියෙන්නේ පද්ධතියක් වශයෙන්. අන්‍යෝන්‍ය සහසම්බන්ධතාවෙන් යුක්තව. ඒක තමයි ඇත්ත. එතකොට ජනමාධ්‍ය වෙන්කොට ගන්න බෑ. එය රටේ සියලුම සමාජ සන්දර්භයන්ගේ කොටසක් විදිහටයි දකින්නෙ. ලෝකයේ ජනමාධ්‍ය ඔක්කොම එහෙමයි. සංයුක්ත අර්ථයෙන්, එය රටට අයිති Material එකක් ලෙස, සමාජ සන්දර්භය තුළ ජනමාධ්‍ය විශ්ලේෂණය කරන්න ඕන. දැන් අහපු ප්‍රශ්නයේ තියෙනවා පැතිකඩක්. මම හිතන්නේ මේ ශාස්ත්‍රාලයීය පර්යේෂණ Academic Research ගැන බලන්න ඕන. මේව අපි අලුතින් හිතන්න ඕන. මම කරන එක අභ්‍යාසයක් තමයි පුංචි ළමයින්ගේ ප්‍රශ්න අහන එක. පොඩි ළමයින්ගේ ප්‍රශ්නයකින් තමයි පටන් ගන්න ඕන. අපි ගොඩක් වල් වැදිල තියෙන්නෙ.

ශාස්ත්‍රාලයීය පර්යේෂණ තියෙන්නෙ කුමකට ද ? ඒ ප්‍රශ්නය අහන්නෙ නැතිව ඉතිරි ප්‍රශ්න වලට යන්න බැහැ. මාක්ස්ගෙ කාලයේ විශ්ව විද්‍යාල වල දැනුම නිෂ්පාදනය කළා. ඒවා කාට ද? ශාස්ත්‍රාලයීය දැනුම ශාස්ත්‍රාලය සඳහායි තියෙන්නෙ. ඔහේ ගොඩගැහෙනව. මොකක් ද ඒවායේ ප්‍රයොජනය? යම්කිසි දැක්මක් නැත්නම් අපි විශ්ව විද්‍යාලවල ගොඩ නගන දැනුම කාටවත් වැඩක් නෑ. ආචාර්ය උපාධි කියයි. නොයෙක් දේවල් කියයි. නමුත් රටේ, සමාජයේ, ජීවිතයේ විපර්යාසය සඳහා ඒවායේ ප්‍රයෝජනයක් නෑ.

මගෙන් අහපු ප්‍රශ්නයේ විදිහට ජනකේන්ද්‍රීය නැත්නම් මහජන යහපත අරමුණු කොටගත් ජනමාධ්‍ය කියන කථිකාවතකුයි, සංකල්පයකුයි ලෝකෙ තියෙනවා. ඒ තමයි පළමුවෙනි දේ. එතකොට අපේ පර්යේෂණ යොමු වෙන්න ඕන මේ මහජන කේන්ද්‍රීය කතිකාවත ගොඩ නැගීම සහ ඒකෙ පරිණාමයත් තුළින් යම්කිසි විපර්යාසයක් පරිවර්තනයක් සමාජයීය පද්ධතිය තුළ ඇති කිරීම සඳහා. සමාජයේ වෙන තැනක පරිවර්තනයක් ඇති වෙනකොට ජනමාධ්‍යයටත් ඒක බලපානව. ඒකයි සිදු වන්නේ. දැන් ඔබට මම උදාහරණයක් කියන්නම්. ජපානයේ ප්‍රධාන ජනමාධ්‍ය ජාලය NHK යි. TV චැනල් හත අටක් තියෙනවා. Radio චැනල් හත අටක් තියෙනව. එහි කිසිම වෙළඳ ප්‍රචාරණයක් කෙරෙන්නෙ

නෑ. අපේ කට්ටිය අපිට කියන්නේ ලෝකයේ ජනමාධ්‍ය හැම තැනම මෙහෙමයි කියල. අපේ වගේ කියල. අපේ වගේ එකක් මං හිතන්නෙ අපේ රටේ විතරයි තියෙන්නෙ. ඒක අපේ රටට අති විශේෂයි. වෙන රටවල වෙනස් වෙනස් ආකාරයෙන් සිද්ධ වෙන්නේ. එතකොට ජපානයේ වෙළෙන්දාට NHK මාධ්‍යයට මැදිහත් වෙන්න බැහැ. නෛතික වශයෙන් දේශපාලනයට මැදිහත් වෙන්න බැහැ. මං කියන්නෙ නෑ ඒක ඒ සමාජයේ පරමාදර්ශී මාධ්‍යයක් කියල. මොකද ටියුඩර් වීරසිංහ මහතා කියපු අදහස බැලුවහොත් ඒ සමාජය ඒකෙන් පිලිබිඹු වෙනව. හැබැයි ඊට වඩා ලොකු ශක්තියක් ඒ රාමුවට දීල තියෙනව. අපේ රටේ තියෙන ප්‍රධානම ලීවර දෙක ඒකෙ ඇතුලෙ ක්‍රියාත්මක වෙන්නෙ නෑ. වාණිජ ප්‍රාග්ධනයයි, දේශපාලන බලයයි. NHK එක තුළ එය ක්‍රියාත්මක වෙන්නෙ නෑ. ඒ නිසා Public Broadcast කියන්නෙ ඇත්තක්. මට එක දවසක් ප්‍රධාන නිෂ්පාදන මහත්තයෙක් එක්ක කතා කරන්න ලැබුණා. එයාලගෙ Vision එක පෙන්නුවා. කරපු වැඩ පෙන්නුව. මට එයා කිව්වෙ ඒගොල්ලන්ගෙ ප්‍රධානතම සංකල්පයක් තියනව කියල. ඒක මෙන්න මෙහෙම කියන්න පුළුවන්. ජපානය මිනිසුන්ගේ මූලික අවශ්‍යතා සන්තර්පණය සඳහා අවශ්‍ය ස්නායු පද්ධතියක් වගේ වැඩ කරන්නේ. මිනිසාගේ මූලික මිනිස් අවශ්‍යතා සන්තර්පණය කිරීම, ඉෂ්ඨ කරගැනීම සඳහා ජනමාධ්‍ය වැඩ කරන්නේ. මූලික මිනිස් අවශ්‍යතා කියන්නේ මොනවද කියල ඒගොල්ලො සංකල්ප හදල තියෙනව. මිනිසුන්ට සංතුෂ්ටියෙන් ජීවත් වෙන්න අයිතියක් තියෙනව. මේක තමයි පළවෙනි එක.

සතුටින් ඉන්න නම් ප්‍රධාන කොන්දේසි දෙකක් තියෙන්න ඕන. මොකක්ද කොන්දේසි දෙක, ගෞරවණීය මනුෂ්‍ය ජීවිතය, මනුෂ්‍ය ගෞරවය, සහ අර්ථය කියන ඔය දෙක නැත්නම් කොච්චර සල්ලි තිබුණත් වැඩක් නැහැ. ඒකෙ පිටිපස්සෙ තියෙනව ලෞකික නූතනත්වයේ ඇති වෙච්ච කතන්දර ගොඩක්. ඒක තමා සමාජ සාධාරණය. ඒක දෙස අපිට ගෞරවයෙන් බලන්න පුළුවන් වෙන්න ඕන. කවුරුවත් කාවවත් පාගන්නෙ නෑ. කවුරුවත් විඩාවට ලක් වෙලා නෑ. කවුරුවත් කාවවත් යටත් කරන්නෙ නෑ කියන එක තමා මනුෂ්‍ය ගෞරවය. අනෙක් අයට අතපාන්නෙ නැතිව ජීවත් වෙන්න පුළුවන් වෙන්න ඕන. දෙවනි කාරණාව අපි කරන

දේ තේරුමක් තියෙන්න ඕනෙ. ඒක ආධ්‍යාත්මික දෙයක් කියල කියන්න පුළුවන්. ඒක තමයි සංතුෂ්ටිය. සමාජ සංතුෂ්ටිය. මේක දාර්ශනික ඇසුරින් විස්තර කරගන්න පුළුවන්.

සමාජයේ තියෙන සියලු ගැටලු පිළිබිඹු වීම විතරයි වෙන්නෙ. මං හිතන්නෙ ආචාර්ය ටියුඩර්ගෙ අදහස ශක්තිමත් කරන්න ඕන. තව ප්‍රයෝජනවත් සංකල්පයක් තියෙනව. ඒක 70 ගණන් වල ගෙනාව වැදගත් සංකල්පයක්. ඒකට මහජන ගෝලය කියල කියනව. ඒකෙන් අදහස් වෙන්නෙ ප්‍රජාතන්ත්‍රවාදය බාධා රහිතව, සීමා රහිතව සමාජයේ යහපත සඳහා පුරවැසියන්ට මැදිහත් වෙලා ජනමතයක් සකස් කිරීමට ඇති හැකියාව. ඒක තමා මහජන ගෝලය කියල කියන්නෙ. නිදහස් ලෙස ජනමතය සකස් කිරීමට ඇති හැකියාවයි ඒ. ඒකෙන් එකක් තමයි ජනමාධ්‍ය. එහිදී සාකච්ඡා, සම්මන්ත්‍රණ, වැඩමුළු, විද්‍යුත් මාධ්‍ය ආදී සියල්ල ඒකාබද්ධ වෙලා මේක හැදෙනවා. දැන් ඒක තුළ තමා ජනමතය සකස් වෙලා තියෙන්නෙ. හොඳට බලන්න අපේ රටේ ජනමතයක් තියෙනවද කියල ? ඒක සකස් වෙලා ද? සංකෝචනය වෙලා ද තියෙන්නේ. ජනමතය කියල දැන් තියෙන්නෙ ආචාර්ය ටියුඩර් කියනව වගේ උඩින් සකස් කර ගත් කතිකාවක් ජනමතය සේ පෙනී සිටිනව. මාධ්‍ය තුළින් ජනමතය ගොඩනගනව. ඒකට ජනමතය සේ පෙනී සිටින්න විශාල බලයක් තියෙනව. අවසානයේ එය ජනමතය බවට පත් වෙනව. විශේෂයෙන් අද බැලුවොත් කොළඹින් පිටට ගියාට පස්සෙ තොරතුරු හරි අදහස් හරි අපි ලබා ගන්නේ ජනමාධ්‍යයෙන් නොවේ. වෙන දේවල් මගින්. මෙතනින් එහාට ගියාට පස්සේ මිනිසුන්ට තියෙන්නේ සකස් කරපු ජනමාධ්‍ය. මේක බලාගෙන කියවන කොට මිනිසුන්ට හිතෙනව මේක තමයි ජනමාධ්‍ය කියල. ඊට පස්සෙ ඒක ඇත්ත වෙනව.

ඇත්තටම ඇමරිකාවෙ තමයි නියම සංහතික ජනමාධ්‍ය තියෙන්නෙ. හැබැයි අන්න එතන ශාස්ත්‍රාලයීය පර්යේෂණ තියෙනවා. සොයන්න ඕන විශ්ව විද්‍යාල තුළ කොහොමද සංහතික ජනමාධ්‍ය සකස් වෙන්නෙ කියල. මං හිතන්නෙ ඒකට අලුතින් හිතන්න අවශ්‍යය යි.

බොහොම ස්තුතියි.

# සත් වන අදහස් දැක්වීම



**ප්‍රියාන් ආර්. විජේබණ්ඩාර**

මට ප්‍රශ්නයක් නෙමෙයි අහන්න තියෙන්නෙ. යම් අදහසක් පමණයි ප්‍රකාශ කරන්න තියෙන්නෙ. "සංඥාර්ථවේදය" මම ගොඩක් ප්‍රිය කරන මාතෘකාවක්. මේ අවස්ථාව ඉතා වැදගත් ඒ පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා. මෙය ශාස්ත්‍රීය සාකච්ඡාවක්. මෙය මහපොළොවට සම්බන්ධ කොට සාකච්ඡා කිරීම වැදගත්.

සංඥාවක් කියන්නේම යම් දෙයක් නියෝජනය කරන තව දෙයක්. එනම් ''දෙය'' නියෝජනය කරන ''දෙය''ක්. එතකොට ඒකෙ අසම්පූර්ණත්වය එතැනම තියෙනවනා. මොකද ''දෙයක්'' මුළුමනින්ම නියෝජනය කරන්න තව දෙයකට බැහැ. සංඥාවලින් කියවෙන බොහෝ දේවල් තියෙනව. බොහෝ දෙනෙක් ඒ ගැන කතා කරනවා. ඒත් ඒ ශාස්ත්‍රීය කතා බහ සංවාද අහසේ මිසක් මහපොළොවත් එක්ක තියෙන සම්බන්ධය අඩුයි. ඒ හින්දා මේ සාකච්ඡාව ඒ වගේ තැනකට ගේන්න පුළුවනිනම් වඩාත් වැදගත්.

තමන් තුළ දෙයක් නැත්නම්,තමන් හිස් නම් තමාගේ පිටිපස්සෙන් තියෙන යම් දෙයකින් තමන්ට අර්ථයක් දෙනව. සමහර ආචාර්ය මහාචාර්යවරුන්ගෙ පොත්වල් පිටකවරයේ පිටුපස දානව පොත් රාක්කයක් ඉස්සරහ ලිය ලියා ඉන්න ඡායාරූපයක්. එතකොට පිටි පස්සෙ තියෙන පොත් රාක්කයෙන් අර්ථයක් දෙනව මෙයා හරි බුද්ධිමතෙක් කියල. කට්ටිය කැමතියි ජර්මන් එහෙම ගියාට පස්සෙ කාල් මාක්ස්ගේ ප්‍රතිමාව ඉදිරියේ ඉඳලා ඡායාරූපයක්

ගන්න. දැන්නම් ගත්තු ගමන් ඒ ඡායාරූපය Face Book එකේ දාලා ලොකු කියවීමක් දෙන්න යනවා. මෙතනින් එළියට බැහැල පාරේ යද්දි ලොකු දේවල් ටිකක් හම්බ වෙනව දකින්න සංවර්ධනය කියල. සංවර්ධනය ගැන කතා කරනව. හැමෝම ඒ දේවල් දකිනව. ගාල්ලෙ ඉඳල කොට්ටාවට එනව පැයෙන්. ඒත් කොට්ටාවේ සිට කොටුවට යන්න පැය දෙකකට වැඩිය ගත වෙනව. ගාල්ලේ සිට කොටුවට අධිවේගී නොවන මාර්ගයේ ගියත් යන්නෙ පැය 4ක් විතර. කාලය එකවගේ වුණත් ''අධිවේගය''කියන එක අධිනිශ්චය වෙනවා. මෙන්න මේව කොහොමද සංඥාර්ථවේදය තුළ සිට කියවන්නෙ ? මහපොළොවට බැස්සහම මෙන්න මේව සංඥාර්ථවේදය තුළ සිට කියවන්න පුළුවන් නම් ඒක තමයි වඩාත්ම හොඳ. ඒක තමයි මගේ පළමුවෙනි කාරණය.

දෙවන කාරණය තමයි, අපේ රෝහණ ලක්ෂ්මන් මහතාත් කතා කළ මාධ්‍ය ආචාරධර්ම පිළිබඳව සාකච්ඡාව. රෝහණ ලක්ෂ්මන් මහතාත් මට උගන්වල තියෙනව. ඒ කාළේ අංශාධිපති හැටියට හිටියේ මහාචාර්ය ආරියරත්න ඇතුගල මහතා. ඒ කාලේ ඔහු මහාචාර්යවරයෙකු නෙවෙයි. එතුමන් ඒ කාලේ සෑහෙන්න ආචාර ධර්ම ගැන කියල දුන්න. රෝහණ සර්ගෙ අල්ලපු මේසෙ හිටපු එතුමා දැන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා. එතුමා අත්සන් කරල තමයි දැන් ජනමාධ්‍යවේදීන්ට හැඳුනුම්පත් නිකුත් කරන්නෙ. එතුමන්ගේ සෘජු අධීක්ෂණය යටතේ පවතින මාධ්‍ය ආයතන කිහිපයක් තියෙනව. ඉතිං රටට මාධ්‍ය ආචාර ධර්ම උගන්න්න අය එහෙම කරන ගමන්ම තමන්ට පුළුවන් තැනකින් ආදර්ශයක් දෙන්න පටන් ගත්තොත් ඒක වඩා හොඳයි. මොකද අවවාද උපදෙස් දෙන ගොඩක් වගකිව යුතු අයගේ ඇත්ත සමාජ ජීවිතය ඇතුළේ ඒ වටිනාකම් දකින්න නෑ. රජයේ පරිපාලනය යටතේ, ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරාගේද යම් අධීක්ෂණයක් යටතේ පවතින ලේක් හවුස් එකේ මාංචු පත්තරය ගත්තොත් ඒකෙ තියෙන්නෙම අපරාධ.අපරාධ කරන විදිහ.පොලිසියට කට්ටි පැනපු විදිහ. නඩු අහක යවන විදිහ වගේ අපරාධ කරන විදිහ ඒකෙන් උගන්නනවා. ඉතිං ජාතික පත්තරයක් වෙන දිනමිණ පත්තරය පිටපත් 15000 ක් විකිණෙන කොට මාංචු පත්තරය 40000 ක් පමණ විකිණෙනවා.

ඒක තමයි ඇත්ත. මේව අතර තියෙන සම්බන්ධය මම හිතන්නෙ වෙනස් ආකාරයකට කියවගන්න අවශ්‍යය යි. ඇතුගල මහත්මා මේ දවස්වල ''මහාසමයම'' කියලා නාට්‍යයක් පෙන්නනවා. ජනාධිපතිවරයාගේ සහෝදරයා වගේම ආරක්ෂක ලේකම්වරයා වන දකුණේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයා යුද්ධයෙන් පසුව ''යුධ වීරයෙක්''හැටියට ඉස්මතුවෙන කාලෙක මහා සමයමේ ''ගෙ ්ඨයිම්බර'' යෝධයාගේ යුද ජයග්‍රහණයෙන් නාට්‍යය ඉවරවෙනවා. සංඥාර්ථවේදයේ පුරෝගාමීන් හැටියට සලකන සෝෂියර්, ලෙවිස්ට්‍රවුස්කි වගේ අය උගන්නපු දේවල් එක්ක පුරාණ ශ්‍රී ලංකාව එක්ක ගලපන්න ගිහින් ඒ කාලයේ සංඥාර්ථ අධ්‍යයනය කිරීම වගේම මෙන්න මේවත් අප සංඥාර්ථවේදය තුළ සිට කියවන්න ඕනෙ.

ස්තුතියි.

# අට වන අදහස් දැක්වීම



**මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,**
**ජනසන්නිවේදන අධ්‍යයන අංශය,**
**කැලණිය විශ්වවිද්‍යාලය.**

**ප්‍රශ්නය:-**

**විශ්වවිද්‍යාලයේ ආචාර්යවරු ලෙස සිටින විට කතා කරනව ජනමාධ්‍ය හරි තැනට එන්න ඕන, ආචාර ධර්ම, වැරදි අඩු පාඩු ආදී බොහෝ දේවල් පිළිබඳව. දේශපාලන තනතුරු වලට ගියහම මේක වෙනස් වෙනව. කලින් ඔබතුමා සඳහන් කළා ජුලි කලබල ආදිය ඇත්ත පත්තරය තුළ වාර්තා කළ ආකාරය. හැමදාම අපි කතා කරනව වැරැද්දක් සිදු වූ විට ජනමාධ්‍ය ආචාර ධර්ම පිළිබඳ, ජනමාධ්‍යවේදය, ජනමාධ්‍යවේදියා සදාචාරාත්මක විය යුතු යි ආදී වශයෙන්. යම් කිසි රීති පද්ධතියක් තිබිය යුතු යි කියල කථා කරනව. එහෙම රීති පද්ධතියක් තාම නිර්මාණය වෙලත් නෑ. ඔබතුමාට යමක් ඇති මේ පිළිබඳව කතා කරන්න.**

**පිළිතුර :-**

මම පෞද්ගලිකව හිතන්නෙ ආචාර්යවරයෙකුට, පර්යේෂකයෙකුට පුළුවන් වෙන්න ඕන තමන්ගේ ශාස්ත්‍රාලයීය ප්‍රවේශය තුළ තමා දන්න කරුණු මතින් නිගමන වලට එළඹිලා ඒවා සමාජගත කරන්න. එතකොට ඒ ආචාර්යවරයා වෙනත් තැනකට යනව ද නැද්ද කියන එක වෙනම කාරණාවක්. ඔබ උදාහරණ ලෙස මාංචු ගන්න. නිකම්ම මාංචු හොඳ නෑ කියනවාට වඩා, ගවේෂණාත්මකව කරුණු ඉදිරිපත් කරන්න පුළුවන් නම් ඒක

තමයි වැදගත්. අද තරගකාරී මාධ්‍ය ව්‍යුහයක් තියෙනව. එයින් කියන්න පුළුවන් නම් මෙවැනි කාරණාවක් සිද්ධ වෙනව කියල ඒක වැදගත්. අද කළ යුතු වන්නේ එවැනි කාරණාවක්. එහෙම නැතිව එකිනෙකාට ඇඟිල්ල දිගුකර ගැනීම වැදගත් නැහැ. කළ යුත්තේ කරුණු මත පදනම් වෙලා සාකච්ඡා කිරීම.

මම සමහර කරුණු පිළිබඳ පර්යේෂණ කරනව. ඒ කරුණු, එක ප්‍රකාශනයකට නැතිනම් තවත් ප්‍රකාශනයකට ඉදිරිපත් කරනව. අද කළ යුතු කාරණාව වන්නේ එකිනෙකාට චෝදනා කර ගන්නවාට වඩා, තම තමන්ගේ භූමිකාව හරියට ඉටු කිරීමයි. නිර්මාණකරුවා නිර්මාණ කරන්න ඕන. ගවේෂණය කරන අය ගවේෂණය කරන්න ඕනෙ. ඔබ කිව්ව සංඥා සංකේතාර්ථ පිළිබඳව. මම මෙයටත් වඩා අපේ පැරණි සමාජය සංඥා සංකේත ඉතා ගැඹුරින් තේරුම් ගත්ත සමාජයක් කියල දකිනව. ලා වර්ණ භාවිතා කරමින් සැහැල්ලු, සංවේදී, සියුම්, සාමකාමී සමාජ ජීවිතයක් පවත්වා ගෙන ගියා. පැරණි අනුරාධපුර යුගයේ ඇඳින ලද සෑම චිත්‍රයකම තද වර්ණ භාවිතා කොට නැහැ. ලා වර්ණ පාවිච්චි කරල තියෙන්නෙ. සමාධි බුදුපිළිමයේ සංඥාර්ථ කියවලා බලන්න. අද නිර්මාණය කරන බුදු පිළිම තුළින් සංඥාර්ථ විඳින්න දෙන්නෙ නැහැ. මෙය සංඥාර්ථ පිරිහී යාමක්.

සමාජ, ආර්ථික, දේශපාලන ක්‍රියා සහ වටපිටාව තුළ අද බොහෝ දේවල් සරල කරල තියෙනව. විඳින්න දෙන්නෙ නැහැ. ජවහර්ලාල් නේරුතුමා සමාධි පිළිමය දිහා බලල කියනව එක් පැත්තකින් කරුණාව පේනව, අනෙක් පැත්තෙන් මෛත්‍රිය පේනව කියල. අද සමාධි පිළිමය දෙස බලා ඉන්න අයට සමාධි පිළිමයේ කරුණාව, මෛත්‍රිය පේනව ද? ඒක දිහා බලා ඉන්න උත්සාහ කරනවද? ඒක යාන්ත්‍රික කරල. හන්දි වල තියෙන එක බුදු පිළිමයකවත් බුදු හිමියන්ගේ දාර්ශනික අරුත් හඳුනා ගන්න ඉඩ දීල තියෙනව ද? ඒක දකින්න පුළුවන් කමක් නැහැ.

භාෂාවේ තියෙන ශක්‍යතාවය ඉතා වැදගත්. අද පොහොසත් වෙච්ච ශබ්ද කෝෂයක් අපට නැහැ. අද "සෙව්වන්දි" මොකක්ද කියල ඇහුවාම එය ගැහැණු ළමයෙකුගේ නමක් කියල කියයි. ඒකෙ අර්ථය හොයන්න තරම් වාග් කෝෂය පිරිපුන් එකක්

නෙවෙයි. ඒකේ පිටුපස තියෙන සාධකය මොකක්ද? අධ්‍යාපනය වාණිජ වෙමින් පවතිනව. තරගකාරී වෙනව. වෙහෙසකාරී වෙමින් පවතිනව. එකිනෙකාට බේද කරමින් පවතිනව. පංති අතර පරතරය වැඩි වෙමින් පවතිනව. අපේ සමාජය නැවත ප්‍රතිසංවිධානය කරන්නෙ නැහැ. අධ්‍යාපනය නිවැරදිව ප්‍රතිසංස්කරණය කරන්න හිතලවත් නැහැ අපි කවදාවත්. අධ්‍යාපනයේ සමානාත්මතාව කියන අදහස කොහේවත්ම තියෙනව ද? නිදහසෙන් පස්සෙ අපි යටත් විජිත වාදය විවේචනය කරමින් කියනව සමානාත්මතාවය මිෂනාරී අධ්‍යාපන ක්‍රමය විසින් වෙනස් කළා කියල. නිදහසින් පස්සේ කාන්තා පිරිමි පාසල්, ක්‍රිස්තියානි බෞද්ධ පාසල් කියන සංකල්පවත් වෙනස් කරන්න උත්සාහ කළා ද? තියෙන පාසල් වලට සියලුම දේවල් තියෙනව. නැති ළමුන්ට නැහැ. මෙම මානසික කලකිරීම, වෙහෙසකාරී බව ප්‍රකාශ කරන්නෙ සංඥාර්ථයක් නොවේ ද? ඒ තුළ කලකිරීම, ඉච්ඡා භංගත්වය තුළ නිර්මාණය වන සංඥාර්ථවේදය අප හඳුනා ගන්නේ නැද්ද? මේ පිළිබඳ කතිකාවතක් ගොඩ නැගීම අවශ්‍යය යි. මේ පිළිබඳව සන්නිවේදනය පිළිබඳ බුද්ධිමතුන්ට ද, සමාජ ක්‍රියාකාරකයන්ට ද කළ හැකි දෙයක් තියෙනව. අප සියලු දෙනා මෙය කළ යුතුයි. අපට කළ හැකියි. අපේ සීමාවන් තුළ කළ යුතුයි කියල මම අදහස් කරනවා.

ස්තුතියි.

# නව වන අදහස් දැක්වීම

**ඩී. එම්. එස්. දිසානායක,**
**අධ්‍යක්ෂක,**
**මහවැලි අධිකාරිය**

නිදහස් වේදිකාවක්, නිදහස් මත දක්වන අවස්ථාවක්. මේක බොහොම සතුටට කාරණයක්. පෙර වදන වගේම, පසු වදනුත් ඉදිරිපත් වෙනව. ඒ වගේම මේ පිළබඳ විග්‍රහ විශ්ලේෂණ ආදිය සාකච්ඡා කෙරෙනව. මං හිතන්නෙ මේක තමයි නිදහස් වේදිකාව. මාත් මේ මොහොතේ සූදානම් වන්නේ යම්කිසි අදසක් මේ විද්වත් සභාව හමුවේ තැබීම සඳහායි.

පළමුකොටම මම ස්තුතිවන්ත වෙනව මේ පර්යේෂණ ඒකකයට. ඉතාමත් මෑත කාලයේ දී පර්යේෂණ ඒකකය ආරම්භ කරල, ග්‍රන්ථ හතරක් එක විට එළි දැක්වීම බොහොම අපහසු කාර්යයක්. සිංහල භාෂාවෙන් ග්‍රන්ථ දෙකක් සහ ඊටම අදාළව ඉංග්‍රීසි භාෂාවෙන් ග්‍රන්ථ දෙකක් එළිදැක්වූවා. මෙහි අන්තර්ගත කරුණු විග්‍රහ කරන්න විශ්ලේෂණය කරන්න අපට තව කාල වේලාව තියෙනව.

බෙහෙවින්ම මම විග්‍රහ කිරීමට උත්සාහ කරන්නේ ඒ කෘති එළිදකින්නේ කුමන සමාජ සන්දර්භයන් තුළ ද කියන කාරණය. අපගේ විද්වත් මණ්ඩලයේ ආචාර්ය ටියුඩර් වීරසිංහ, මහාචාර්ය ටෙනිසන් පෙරේරා, මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස, ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන යන එතුමන්ලාගේ අදහස් අනුව අපි ගොනු කළ හොත් මේක තමා පරම සත්‍යය, මේක තමා එකම දේ, කියන නිගමනයකට එළඹෙන්න බැහැ. විවිධ වූ අර්ථ කථනයන් තියෙනව. අපි ගතහොත්, ග්‍රන්ථයක Reference කොපමණ ප්‍රමාණයක් තිබිය

යුතු ද? University වල නිගමනයකට ඇවිත් තියෙනව මෙච්චර ප්‍රමාණයක් තියෙන්න ඕනෙ කියල. ඒකට ලකුණු ලබා දෙනව. හැබැයි හැම එකක්ම ලකුණු ගන්න ඕනෙත් නැහැ. Reference එච්චරම ඕනෙත් නැහැ. Reference අවශ්‍යයත් නැහැ. අදහස් ඉදිරිපත් කිරීමේ අයිතියකුත් අද යුරෝපයේ පිළිගන්නවා. අද Reference ඇත්තෙත් නැහැ. Reference දෙන්නෙ University වල ලකුණු ගන්න.

මම කියන්නේ මේක විවර වෙන්න ඕනෙ මහා සමාජ සංස්කෘතියකට. ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන මහත්මයාගේ කතාවේ සඳහන් වුණා ජපානයේ NHK ආයතනය පිළිබඳව. NHK ආයතනය හරි ජපානයට. NHK World News ඔබ අහනව ඇති. මේ ළඟදි එහි ප්‍රචාරය වුණු ප්‍රවෘත්තියකින් මට අහන්න ලැබුණ චීනයත් සමග ප්‍රශ්නයක් ඇති කරගෙන කියල ජපානය. ඔකිනාඕ දූපත සම්බන්ධයෙන්. මේ NHK ආයතනයේ ප්‍රවෘත්ති නිර්මාණය වෙන්නේ ඔවුන් සතු අයිතිය ගැන. එහා පැත්තේ CCTV. ඒකට දාල බැලුවාම චීනයේ අයිතිය තහවුරු කිරීම සඳහා ප්‍රවෘත්ති විකාශනය කෙරෙනව. ඒකෙන් අදහස් වෙන්නේ මොකක් ද? වර්තමානයේ ජනමතය ගොඩනැගීම සඳහා තමයි නූතන මාධ්‍ය කටයුතු කරන්නෙ. ඒ සඳහා නිදහස තියෙනව. ජපානයේ NHK එකටත්, චීනයේ CCTV එකටත් ඒ සඳහා නිදහස තියෙනව.

හැබැයි අපේ රටේ වගේ මේ තුන්වන ලෝකයේ අඩු පහසුකම් ඇති රටවල බොහොම අමාරුවෙන් කැමරාවක් හොයාගෙන, එහෙම නැත්නම් ඒ කරපු එක PDF කරල එවන්න සමහර ආයතන වලට දැන් පුළුවන්. බස් එකේ කැසට් එක අහපු යුගයක් ඊයේ පෙරේද වෙනකම්ම තිබුණෙ. ඒ අයටත් ඒක තියෙනව. බොහෝ විද්වතුන් කල්පනා කරනව යුරෝපයේ ඒක තියෙනව, ඒක හොඳයි කියන එක. අපිත් පිළිගන්නව. හැබැයි දේශීය මාධ්‍යකරුවොත් ඒ පසුපස යමින් යමක් කරනව. යමක් කරන නිසා තමයි අපිත් යම් යම් දේවල් දන්නෙ.

දැන් නවගත්තේගම ගුරුවරිය දණගස්වපු සිද්ධිය මාධ්‍යයෙන් ප්‍රචාරය වෙලා දැනගත්ත නිසානෙ මේ හැම පාසලකම බැනර් දාල ඒ වෙනුවෙන් පෙනී සිටියෙ. ඒ සිද්ධියට සම්බන්ධ මන්ත්‍රීවරයව

පක්ෂ නායකත්වයට බේර ගන්නත් බැරි වුණා. පක්ෂයෙන් ඉවත් වෙන්න සිද්ධ වුණා.

ඉතිං මං හිතන්නෙ මේ තුන්වෙනි ලෝකයෙත්, අඩු පහසුකම් තියෙන පුංචි රටෙත් එවැනි උත්සාහයන් නැතුවම නොවෙයි. දැන් සියඹලා ඇත්තෙම නැද්ද? තියෙනව. හැබැයි අපි ඒක සියඹලා ලෙස දකින්නෙ නැහැ. අන්න ඒ විඥානයත් සහ විචාරශීලීත්වයත් ගොඩනැගිය යුතු වෙනව. යමක් පසුපස යාමට වඩා, අපේ මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස මැතිතුමාත්, ආචාර්ය ටියුඩර් වීරසිංහ මැතිතුමාත් සඳහන් කළ ආකාරයට අප විසින් යමක් නිර්මාණය කරල අප විසින්ම එය සමාජගත කරන්නට තනි තනියෙන් උත්සාහයක් ගත යුතු වෙනව. එයයි මගේ අදහස.

මේ නිදහස් වේදිකාවේ ඒ සඳහාත් ඉඩ හසර ලැබීම පිළිබඳව සතුටු වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනව.

බොහෝම ස්තුතියි.

# දසු වන අදහස් දැක්වීම



**ආචාර්ය ටියුඩර් වීරසිංහ,**
**මණ්ඩපාධිපති,**
**ශ්‍රී පාලි මණ්ඩපය,**
**කොළඹ විශ්වවිද්‍යාලය.**

**ප්‍රශ්නය :-**

**මගේ ප්‍රශ්නය මණ්ඩපාධිපති ආචාර්ය ටියුඩර් වීරසිංහ මහතාට. මීට පෙර සාකච්ඡා වලින් සඳහන් වුණා ගිනි තියාගත්ත ස්වාමීන් වහන්සේ පිළිබඳව. පුවත් පත් වලින් මම දැක්ක සමාජ සදාචාරයක් තිබුණෙ නැද්ද කැමරාව අයින් කරල ඔහුව බේරගන්න කියල. මම අහන්නේ මාධ්‍ය භූමිකාව විය යුත්තේ ඒක ද? සුනාමි අවස්ථාවේ දී අපි දුටුවා සුනාමියට හසු වූ කාන්තාවකගේ චේන් එක ගලවන දර්ශනයක්. ඒ වෙලාවේ කළ යුතු වන්නේ එය ප්‍රවෘත්තියක් හැටියට ඉදිරිපත් නොකර අර අවස්ථාවට මැදි වෙලා ගුටි බැට දී හෝ ඇය බේරා ගැනීම ද?**

**පිළිතුර :-**

ඒ ස්වාමීන් වහන්සේ ගිනිතියා ගැනීම ඇත්ත වශයෙන්ම අහඹු දෙයක් නෙමෙයි. පළමු කාරණය තමයි පසුගිය අවුරුදු 3 - 4 ක පමණ කාලසීමාව තුළ ලංකාවේ සිදු වූ දේශපාලන වෙනස් වීම. LTTE සංවිධානය විනාශ වීමත් සමග සමාජය නියාමනය තුළ තිබූ එක් සංරචකයක් මුළුමනින්ම විනාශ වෙලා ගියා. කවුරුත් ඒක මතු කළෙත් නැහැ. නමුත් මම හිතන්නෙ එහෙමයි. ඕනෑම සමාජයක් නියාමනය කිරීමට පාලනය කිරීමට මානසික ක්ෂේත්‍රයක් තියෙනව. ඒක ප්‍රකාශයට පත් වෙන්නෙ දෘෂ්ටිවාදය ඔස්සේ. LTTE සංවිධානය තියෙනකොට ලංකාවේ තිබුණා ප්‍රජාතන්ත්‍රවාදය.

ප්‍රජාතන්ත්‍රවාදය තියෙන්න නම් අනිවාර්යයෙන්ම පක්ෂ දෙකක් තියෙන්න ඕනෙ. කණ්ඩායම් දෙකක් තිබුණා. ඒ දෙක අතර මතවාදී අරගලයක් තිබුණා. පසුව එය සන්නද්ධ අරගලයක් බවට පත් වුණා. ඒක විනාශ කළා. දැන් ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන කතා කරන්න බැහැ ඇත්ත වශයෙන්ම. දැන් අපි ජීවත් වෙන්නේ පශ්චාත් ප්‍රජාතන්ත්‍රවාදී රටක. හුඟ දෙනෙක් හිතාගෙන ඉන්නව ප්‍රජාතන්ත්‍රවාදී රටක ජීවත් වෙනව කියල. පෙළපාලි යනව ප්‍රජාතන්ත්‍රවාදය ගැන. ඒ පිළිබඳ කතාවල් පවත්වනව. ශාස්ත්‍රීය පොත පත ලියනව. ඒක ඇත්ත වශයෙන්ම එක්තරා ආකාරයක විහිලුවක් වගේ මට පේන්නෙ. ප්‍රජාතන්ත්‍රවාදයක් පවතින්නට අවශ්‍ය මූලික පදනම දැන් නැහැ. එතනයි ප්‍රශ්නෙ තියෙන්නෙ.

දැන් මේ මොහොත වන විට විරුද්ධ පක්ෂයක් ඇත්තෙම නැහැ. වම දියවෙලා ගිහිල්ල සම්පූර්ණයෙන්ම. සංහතික සංස්කෘතික විකාශනය විසින් සමාජයේම තියෙන පංති ප්‍රභේදය ආදිය යම් ආකාරයක තුලනයකට ගෙනත් තියෙනව. පංති භේද නැහැයි කියන්න බැහැ. පංති භේද තියෙනව. මේ නිසා කලින් සමාජයේ මානසිකත්ව ක්ෂේත්‍රය හසුරුවන්න තිබුණු ප්‍රධාන බලවේගයක් නැති වෙලා තියෙනව. LTTE එක නැති වීම නරකයි කියන එක නෙමෙයි කියන්නෙ ඇත්ත වශයෙන්ම. හොඳයි කියන එකත් නෙමෙයි. ඒක නිසා මතු වෙච්ච ගැටලු. ඒක දේශපාලන දෘෂ්ටියක් නෙමෙයි. ඒක සමාජය පිළිබඳ විද්‍යාත්මක දෘෂ්ටියක්. ඒ නිසා පසුගිය වසර 3 - 4 තුළ පැවතුන සමාජ ක්‍රියාවලිය පාලනය කරන්න වෙන ක්‍රමවේදයක් දැන් අවශ්‍යය යි. දැන් ඒකට විකල්ප මතු වෙනව. බොදු බල සේනාව, රාවණා බලය, හලාල් ආදී දේවල්. ඒවා සමාජයට උඩින් ගොඩ නැගෙන්නෙ.

සංහතිකය හෝ Mass නොමැති විට මුකුත් තේරුම් ගන්න බැහැ. මාධ්‍ය කියන්නේ මොකක්ද? ඒක ඉතා පුංචි බිංදුවක් විතරයි. ලොකු සමාජ ක්‍රියාවලියක් සිදු වෙන්නෙ. මේ පිළිබඳ හුඟ දෙනෙක් සවිඥානික නැහැ . නිර්වින්දනය වෙලා ඉන්නෙ අර Mass Ideology එකත් එක්ක. මේ තත්ත්වයම තමයි 1990 දී ලෝකයට උදා වුණේ. ලෝකයේ ගෝලීය ප්‍රජාතන්ත්‍රවාදය 1991 අභාවයට ගියා. සෝවියට් සංගමය ඇතුළු ලෝකයේ සමාජවාදී රටවල් බිඳ වැට්ටුව. ලෝකයේ

එක බලයක් එළියට ආවා. එතකොට කොහොමද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරන්නෙ.

ටියුනීසියාවෙන් පටන් ගත්ත යුද්ධ කටයුතු වලට එරෙහි වීමට අද එක බලයක් තියෙනව ද පෘථිවි තලයේ. සංවාදයක් ඇති කරන්න පුළුවන් ද එක්සත් ජාතීන්ගේ සංවිධානයට. මෙතනයි ගැටලුව තියෙන්නෙ. එක් පැත්තකින් ගෝලීය වශයෙන් තිබුණු ප්‍රජාතන්ත්‍රවාදය නිමාවට පත් වුණා. ගෝලීය වශයෙන් අප පශ්චාත් ප්‍රජාතන්ත්‍රවාදී අවධියකට පත් වුණා. අද අලුත් ක්‍රම හොයනව මිනිසුන්ව පාලනය කරන්න. මිනිසුන්ගේ අදහස් විවිධයි. සංකීර්ණයි. ස්වයංව පාලනය කරල මේව කරන්න බැහැ කවදාවත්.

සමාජයක් පාලනය කරන්න මානසිකත්ව ක්ෂේත්‍රය හසුරුවන සමස්තය විසින් මෙහෙයවන යම් දෘෂ්ටිවාදයක් අවශ්‍යය යි. දෘෂ්ටි වාදයක් පවත්වාගෙන යන්න බැහැ ඒකට හතුරෙක් නැත්නම්. හතුරෙක් අවශ්‍යය යි. අද අපට තියෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි හතුරෙකු නැතිකම. හතුරෙකු හොයා ගන්න තමයි දැන් මේ ගොල්ලන් කෑ ගහන්නෙ. හතුරො නැහැ. හතුරෙක් ඕනෙ. අනිත් එක ඔවුන් කියන දේවල් හරිද කියන එක නෙමෙයි ප්‍රශ්නෙ තියෙන්නෙ. මොනවහරි කියන්න ඕන මිනිසුන්ට හතුරාගේ ස්වරූපය ඇති කරන්න.

හාමුදුරුවන්ගේ ගිනිතබා ගැනීම අහඹු සිද්ධියක් නෙමෙයි ඇත්ත වශයෙන්ම. පශ්චාත් යුධ සංග්‍රාමික වූ අප සමාජයේ මතු වූ දේශපාලනික දෘෂ්ටි වාදයෙහි, ආර්ථික ක්ෂේත්‍රයෙහි සහ වාර්ගික ක්ෂේත්‍රය තුළ අලුත් ව්‍යාපාරික පංතියක් නිර්මාණය වුණා. කොමිස්, වංචා, දූෂණ ආදී වශයෙන් විශාල වාණිජ ප්‍රාග් ධනයක් සමාජයට පැමිණියා. මේ ප්‍රාග් ධනය විසින් ලාභ හොයනව. ඒකට අවශ්‍ය පසුබිම නිර්මාණය කරන්න අවශ්‍යය යි. ඒ සඳහා සංහතිකය භාවිතා කරනව. හැමදාම සිදුවුණේ ඒ දෙය තමයි. සංහතිකයින් කියන්නේ Masses ලා. ඒක තමයි පළමුවෙනි කාරණය.

දෙවෙනි කාරණය තමයි, දැන් හාමුදුරුවෝ ගිනි තියා ගන්න කොට මාධ්‍යවේදියා එතන හිටිය. ඇයි මාධ්‍යවේදියා විතරක් කියන්න ඕන ලයිටරය අයින් කරගන්න, බෝතලය අයින් කරගන්න කියල. තවත් අය එතන හිටියා. ආරක්ෂක අංශයත් හිටියා. හමුදාව හිටියා. සාමාන්‍ය පුරවැසියොත් හිටියා. ඒ ගොල්ලො මොකක්ද

කළේ ? මම හිතන්නේ මෙතනදී මාධ්‍යවේදියා තමන්ගේ වෘත්තීය කාර්ය භාරය හරියටම ඉෂ්ඨ කළා කියල. හැබැයි සමාජ සදාචාරය පිළිබඳ ගැටලුව මතු වෙන්න පටන් ගත්ත. මෙන්න මෙතනයි ගැටලුව තියෙන්නෙ. එය මාධ්‍යයේ තියෙන ගැටලුවක් නොවේ.

ඕනෑම පද්ධතියක් එක්ක යන්ත්‍රණයක් තියෙනවා මම දකින විදිහට. මම හැම වෙලාවෙම ගන්නෙ බටහිර උදාහරණ. මම හිතන්නෙ අපිත් කවදාහරි එතනට තමයි එන්නෙ කියල. ඒක තමයි මගේ අදහස. වෙන විකල්පයක් වෙන දෙයක් එතන නැහැ. සමාජයක් විදිහට මේ යන්නේ ඒ ගමන. එතකොට මෙතනදි අපේ තිබුණු ලොකු අඩුපාඩුවක් තමයි සාපේක්ෂව බලද්දී අපේ විදිහ කියන එක. එහෙම කියන්නත් පුළුවන්. මොකද මේක ක්‍රියාවලියක්.

සමාජයේ ප්‍රධාන සංඝටක තුනක් තියෙනවා. එකක් තමයි අපේ රටේ ඉන්න සිවිල් සමාජය, පුරවැසි සමාජය. දෙක ප්‍රබුද්ධ ක්‍රියාවලිය. Intelligensia කියන එක. තුන් වෙනි කාරණය තමයි දේශපාලනඥයෝ කියන එක. විවිධ සමාජ වල සමාජ පරිණාමයේ දී මේ අයගේ භූමිකාව එක එක තලවල තියෙන්නේ. දැන් ප්‍රංශය ගතහොත් ප්‍රංශයේ බුද්ධිමතුන්ගේ භූමිකාව දේශපාලනඥයන්ගේ භූමිකාවට වඩා විචාරාත්මක, විවේචනාත්මක භූමිකාවක් ලෙස හඳුන ගන්නව. ඒක නිසා ප්‍රංශ රාජ්‍ය සහ බටහිර පුරවැසි සමාජය ලෝකයේ කැපී පෙනෙන සමාජයක් බවට පත් වෙලා තියෙනවා. එංගලන්තයෙ මෙයට වඩා වෙන තත්ත්වයක් තියෙන්නෙ. ජර්මනිය ගතහොත් තව තත්ත්වයක්. රුසියාව ගත හොත් තව තත්ත්වයක්. ලංකාව ගතහොත් මොකක්ද තත්ත්වය. සුනිල් විජේසිරිවර්ධන මහතාගේ "පුරවැසි මංපෙත්" නැමැති කෘතියෙහි ලංකාවේ මේ ප්‍රශ්නය යම් ආකාරයකට විස්තර කරල තියෙනව.

ලංකාවේ ඓතිහාසික වශයෙන් ප්‍රබුද්ධ ප්‍රජාව කියන එක යම් ආකාරයකට බිහිවීගෙන ආවත් එය ගෝත්‍රික වර්ගවාදී සමාජය විසින් ගිල ගත්තා. ඉන්දියාවේ එහෙම නොවෙයි සිදුවුණේ. ඉන්දියාවේ තාගෝර්ලා, ඉන්දියාවේ බෞද්ධ ලේඛකයින්, සංගීතඥයින් ඒගොල්ලන්ගේ සමාජයේ විතරක් නොවෙයි, යුරෝපීය ශිෂ්ට සම්පන්න දේවල් එකට කැටි කර ගත්තා. අපි ඒවාට රාමුවක් දැම්මා.

ඒ නිසා මොකද වුණේ අපි අර බුද්ධිමය වශයෙන් නොදියුණු

ජාතියක් බවට පත් වුණා. අපි පරාධීන ජාතියක් බවට පත් වුණා. බලය සම්බන්ධයෙන් රාජ්‍ය සම්බන්ධයෙන් විවේචනාත්මක සම්බන්ධයක් තිබුණේ නැහැ. ඒ නිසා අපේ රාජ්‍යයටත් ඒ ගතිය බලපෑවා. එතකොට ඒ බලපාන ලද ප්‍රතිඵල තමයි මේ තියෙන්නේ. නිදහස ලබලා දැන් අවුරුදු 60 ගණනක් විතර වෙනවා. බටහිර යුරෝපයේ මේ පිළිබඳ ප්‍රබල කතිකාවක් නිර්මාණය වුණා. නමුත් ලංකාවේ එහෙම වුණේ නැහැ. ඒ කතිකාව ප්‍රංශයේ වෝල්ටෙයාර්ලා, රූසෝලා එහෙන් ගෙනාවා. එංගලන්තයේ ජෝන් ලොක්ලා, බේකන්ලා, රුසියාවේ ලෙමන් සෝෆ්ලා, නදී ෂිෆ්ලා ගෙනාවා. අපේ එහෙම ගෙනාපු කිහිප දෙනෙක් හිටියා. නමුත් අපේ ඒක එහෙම වුණේ නැහැ. ඒ නිසා මම හිතන්නේ හාමුදුරුවන්ගේ ගිනි තබා ගැනීම ඔහුගේ මනසින් ආපු ක්‍රියාවක් නෙමෙයි. ඒක ආවේ සමාජ ව්‍යාපාරයෙන්, උඩින් ආපු එකක් ලෙස තමයි අවසානයේ කූටප්‍රාප්තියට පත් වුණේ. ඒ නිසා තව ඉදිරියටත් මේ වගේ දේවල් වෙන්න පුළුවන්. මොකද ව්‍යුහය තියෙනවනෙ. එක සිද්ධියක් විතරයි වුණේ. මාධ්‍ය ඕනෑම වෙලාවක අල්ලගන්නේ සිද්ධිය පමණයි. ඒක මාධ්‍යයේ දිළිඳු භාවය යි. ගුරුවරයා දණ ගස්වපු එක අල්ලගෙන මාධ්‍ය හැම තිස්සේම ක්‍රියාත්මක වෙනවා. සමාජ ව්‍යුහය වෙනස් කරන්න ඕන. ඒකටයි මාධ්‍ය ක්‍රියාත්මක වෙන්න ඕන.

ස්තූතියි.

# ඒකොළොස් වන අදහස් දැක්වීම



**චන්දන විජේකෝන්,**
**ලේක් හවුස් ආයතනය,**
**කොළඹ.**

මම පොඩි අදහසක් ඉදිරිපත් කිරීමේ අරමුණින් කතා කරන්නේ. මම හිතන විදිහට අපේ සමාජය අද බරපතල අර්බුදයකට පත්වෙලා තියෙනවා. ඒකට ප්‍රධාන වශයෙන් මාධ්‍ය වගකියන්න ඕන. නමුත් ප්‍රධාන වශයෙන්ම තියෙන කාරණය තමයි අපේ සමාජය බරපතල මූලධර්මවාදී ප්‍රතිපත්තියකට තල්ලු කරලා කියන එක. මෙම මූලධර්මවාදී ප්‍රවේශයට සමාජය තල්ලු කළේ විවිධ කාල පරිච්ඡේදයන්වල මේ රට පාලනය කළ පුද්ගලයන්. ඒ නිසා තමයි අපි අද යම් ව්‍යුහයක් ගොඩනගන්නේ. මෙම ව්‍යුහයේ යම් වෙනසක් ඇතිවෙන්න ඕනෙ. ඒ නිසා තමයි අපිට තේරුම් ගන්න බැරි වෙලා තියෙන්නේ මේ මුලු මහත් සමාජ සන්දර්භය තුළම අපේ රට මොකක්ද කියලා. අපේ මාධ්‍ය තේරුම් අරගෙනත් නැහැ. ඒකට හේතුව තමයි අපේ රාජ්‍ය මාධ්‍ය ගත්තත්, පෞද්ගලික මාධ්‍ය ගත්තත් මේ රට මූලධර්මවාදී ප්‍රවේශයකට තල්ලු කිරීම.

සරල කාරණයක් තමයි ජනවර්ගය මුල් කරගෙන ප්‍රවෘත්ති පලකිරීම. දෙමළ තරුණයො අත්අඩංගුවට ගන්නවා. මුස්ලිම් නමත් දානවා. සිංහල සමාජයේ මිනිස්සු මොනවා කළත් ඒක අපි භාවිතා කරන්නේ නැහැ. දෙමළ, සිංහල, මුස්ලිම්, මොන සමාජ ක්‍රමය ගත්තත් වැරදි කරන මිනිස්සු ඉන්නවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මෙම වාර්තාකරණය තුළ. අප මාධ්‍ය විසින් සමාජය මූලධර්මවාදී ප්‍රවේශයකට තල්ලු කොට ඇති බව පැහැදිලියි.

මෙයට ප්‍රධාන වශයෙන්ම වගකියන්න ඕනෙ මේ සමාජයේ මාධ්‍ය මෙහෙයවන අය. දැන් අපි දන්නවා අර ස්වාමීන් වහන්සේ ගිනි තියා ගත්තා. දැන් එය වාර්තාකළ මාධ්‍යවේදීන්ගෙන් ප්‍රශ්න අහනවා ඔබට මෙය වළක්වන්න තිබුනෙ නැද්ද කියලා. නමුත් ප්‍රශ්නය තියෙන්නේ දැන් ඒ හාමුදුරුවන්ව එතෙනට තල්ලු කළේ කවුද කියන එක. මූලධර්මවාදී සමාජය විසින් හාමුදුරුවන්ව එක කොනකට තල්ලු කළේ මූලධර්මවාදීව මෙහෙයවන සමාජ කණ්ඩායම්. ඒ නිසා අපි මාධ්‍යවේදීන් හැටියට අපේ කකුල් දෙක පොළොවෙ ගහගෙන අපි මේ සමාජය දෙස බලන්න ඕන. මේක බහුවාර්ගික රටක් කියන ප්‍රවේශයට අපිට එන්න බැරිනම්, නැත්නම් මාධ්‍ය බහුවිධත්වය තේරුම් ගන්න බැරිනම් මේක අශිෂ්ට සම්පන්න සමාජයක් බවට පත්වේවි.

මාධ්‍යවේදියාගේ යම් වගකීමක් තියෙනවා. අද අපේ සමාජයේ මාධ්‍යවේදියා අසරණ වෙලා ඉන්නේ. අපි සියලු දෙනාම එක්තරා බල අධිකාරයක සේවකයෝ බවට පත්වෙලා තියෙනවා. මේකට හේතුව තමයි මාධ්‍යවේදීන් අතර යම් සංගායනාවක් නොමැතිකම. මෙය නැතිකම නිසා තමයි මාධ්‍යවේදීන්ට ආචාර ධර්ම තියෙන්නේ. 1981 ආචාරධර්ම පද්ධතිය තියෙනවා. පුවත්පත් මණ්ඩලය මගින් ගෙන එන ලද ආචාරධර්ම තියෙනවා. මේක අපට පොදු පෙරහුරුවක් දෙනවා. ඔබලට මාධ්‍ය ආචාරධර්ම රකින්න බැරිනම් ඔබලව තල්ලු වෙන්නේ මෙන්න මෙතන්ට කියන එක. ඒ නිසා මාධ්‍යවේදින්ට තියෙන්න ඕනෙ ස්වයං වාරණයක්. අප කළ යුත්තේ කුමක්ද? නොකළ යුත්තේ කුමක්ද? කියන එක පිළිබඳව. මාධ්‍යවේදීන් මෙය තේරුම් ගත්ත නම් ඔවුන්ට පවතින මූලධර්මවාදී සමාජය බිඳින්න පුළුවන්.

මෙතන ප්‍රකාශ වුණා ආචාරධර්ම අවශ්‍ය බව. ආචාරධර්ම අවශ්‍යයයි. ඒක යම් පාලන අධිකාරියකින් කළ යුතු දෙයක් නොවෙයි. ඒක මාධ්‍යවේදීන් විසින්මයි කළ යුත්තේ. ඉන්දියාවේ මාධ්‍යවේදීන් තමන් විසින්ම සකසාගත් ආකෘතියක් තුළ සිට රටේ පැවැත්මට, සුභ සාධනයට එරෙහිව බලපාන ප්‍රවෘත්ති ඔවුන් පල කරන්නේ නැහැ. නමුත් අපිව එතෙනට තල්ලු කරලා තියෙන්නේ මේ බල අධිකාරිය විසින්. ඒ නිසා මේක බරපතල ප්‍රශ්නයක්. මෙම

මූලධර්මවාදී ක්‍රමවේදයෙන් මුදවා ගැනීමේ වගකීම තියෙන්නෙත් අපිට. මේවා පෙන්වා දීමේ වගකීම තියෙන්නෙත් අපිට. මේක පැහැදිලි කරගන්න බැරි වුනොත් අප මාධ්‍යවේදීන් හැටියට පමණක් නොව විද්වත් ආචාර්යවරු ලෙස ද බරපතල අර්බුදයකට යනවා. අපිට වෙනසක් අවශ්‍යයි කියන එක තමයි මගේ අදහස.

ස්තුතියි.

# දොළොස් වන අදහස් දැක්වීම



**ආචාර්ය ටියුඩර් වීරසිංහ,**
**මණ්ඩපාධිපති,**
**ශ්‍රී පාලි මණ්ඩපය,**
**කොළඹ විශ්වවිද්‍යාලය.**

**ප්‍රශ්නයඃ-**

**මෙම ප්‍රශ්නය ආචාර්ය ටියුඩර් වීරසිංහ මහතාට. ඔබතුමා පැහැදිලි කළා අපි දැන් ඉන්නෙ පශ්චාත් ප්‍රජාතන්ත්‍රවාදී යුගයක බව. එතකොට ඔබතුමාගේ තර්කය ගොඩ නැගෙන්නේ දයලෙක්තිකයක් උඩ. අපට ප්‍රජාතන්ත්‍රවාදය තියෙනව. ඇන්ටි ප්‍රජාතන්ත්‍රවාදයත් තියෙනව. ඒකත් ඉවර කළහොත් අපි යන්න ඕන Synthesis එකකට. අපි එහෙම එකකට ගියා ද? Synthesis එක නැතිව පශ්චාත් ප්‍රජාතන්ත්‍රවාදී යුගයකට ගියා නම් ඒ කියන්නෙ අපි ඉගෙන ගත්ත දයලෙක්තික් මොඩලය නැත්නම් Synthesis, Anti - Synthesis මොඩලයත් වෙනස් වෙන්න ඕන ද? නැත්නම් පශ්චාත් දයලෙක්තික යුගයකට ගිහිල්ල ද?**

**පිළිතුරඃ-**

දයලෙක්තිකය කියන සංකල්පය ඇත්ත වශයෙන්ම ප්‍රබුද්ධ විදිහට පැරණි ග්‍රීසිය වැනි රටවල භාවිතා කළා. ඊට පස්සෙ හේගේලියානු දර්ශනයෙත් භාවිතා කළා. දයලෙක්තිකය කියන එක තුළ වාදය, සහවාදය, ප්‍රවාදය කියන ඒව තමයි මූලික ක්‍රියාවලිය බවට පත් වන්නේ. නමුත් ඒක එලෙස නවතින ක්‍රියාවලියක් නෙමෙයි. අපි දැන් Synthesis එකට ඇවිල්ල එහෙම නැත්නම් යම්කිසි සහවාසයකට ඇවිල්ල කියල කියන්න බැහැ. LTTE සංවිධානය තිබුණා. මේ පැත්තෙන් රාජ්‍ය තිබුණා. මේ දෙක අතර අරගල ඇති

වුණා. මේ දෙක මේ ආකාරයට අරගලයට ගියා. ඔන්න Synthesis එක ආවා. දැන් ඒක තියෙන්නෙ දයලෙක්තික ක්‍රම වේදයට අනුව. ඊළඟ සමාජය විතරක් නෙමේ ඇත්ත වශයෙන්ම ඕනම දෙයක මේක වෙන්න පුළුවන්. දැන් මේක මාක්ස්ට විසඳන්න බැරි වුණ ප්‍රශ්නයක්. මොකද මාක්ස් කොමියුනිසිට්වාදයේ දී මීට එහාට මේවා පිළබඳ කතා කළේ නෑ. ඇත්තටම බුදුන් වහන්සේ නිර්වාණය පිළිබඳ දේශනා කළා. නමුත් එහෙම දෙයක් තියෙනව ද කියල කවුරුත් දැක්කෙ නැහැ. ඒක නිකං අදහසක් විතරයි. එතකොට මාක්ස්වාදය මෙන්ම කොමියුනිස්ට්වාදයත් ඒවගේ දෙයක්. නමුත් මම හිතන්නෙ මානව සමාජයේ හැම දෙයක්ම මානවයාගේ ඉතිහාසය දිහා බලල තමයි ගොඩනගා ගන්නෙ.

මානව සමාජයේ ඉතිහාසය දිහා බැලුවහම පේන එක් ලක්ෂණයක් තමයි සමස්තයක් විදිහට ගත්තහම එය මිනිසුන් මිනිසුන් අතර, කණ්ඩායම් කණ්ඩායම් අතර, වර්ග වර්ග අතර, ජාති ජාති අතර, සමාජ සමාජ අතර, ශිෂ්ටාචාර ශිෂ්ටාචාර අතර, සංස්කෘතීන් සංස්කෘතීන් අතර අරගලයක් තියෙන බව. පැවැත්ම සඳහා අරගලයක්. එතකොට මේ අරගලය විස්තර කිරීම සඳහා අපට දයලෙක්තික් ක්‍රමවේදය භාවිතා කරන්න පුළුවන්. හැබැයි ඒකෙ නිමාවක් නෑ. මානව සංහතිය ඒ පැවැත්ම මේ තියන තත්ත්වයන් යටතේ කොන්දේසි යටතේ ඒවා තුළ යම් යම් විදිහට අන්තර් රෝපණය වෙලා. මේව තුළ මේ අරගලය සිදු වෙනව. එතකොට යම් කිසි Stage එකෙන් Stage එකට එන්න පුළුවන්. දැන් උදාහරණයක් ගතහොත් අපි ප්‍රාථමික සමාජයේ ජීවත් වුණු ආකාරය නිශේධනය කරලා. ඊට පස්සෙ බිහි වූ සමාජයේ තියෙන්නෙ රාජ්‍යයන්. සමාජයේ සහසම්බන්ධතා බිහි වුණා. ඒවා අතර ප්‍රභේදයන් පංති භේද ඇති වුණා. දැන් මොකද වෙලා තියෙන්නෙ? දැන් රාජ්‍යයන් අතර තියෙන අරගලයේ අවධියකට ගිහිල්ල. මේ වෙනකොට Global Stage එකකට ඇවිල්ල තියෙනව. දැන් ජාතික රාජ්‍යයන් කියන එකේ කිසිදු වැදගත් කමක් නැහැ. දැන් අපි ජීවත් වෙන්නේ ගෝලීය යුගයක. ගෝලීය යුගයේ තියෙන්නෙ මොනව ද? ගෝලීය යුගයේ තියෙන්නේ මේ පොළොවෙ ඉන්න හැම ජාතිකමට, හැම මනුෂ්‍යයෙකුටම, හැම ජන ප්‍රජාවකටම තියෙන

සම්පත් සමානාත්මකතා ලෙස සහයෝගයෙන් සහෝදරත්වයෙන් බෙදා ගන්නා ක්‍රමයක් නෙමෙයි ඇත්ත වශයෙන්ම. එහෙම තමයි දැන් බටහිර අර්ථ කථනය කරල තියෙන්නෙ. ගෝලීයකරණය තුළ වෙන්නෙ මොකක්ද? අර අරගලය ඇත්ත වශයෙන්ම තවත් දීර්ඝ වෙනව. සමාජය ගමන් කරනවා.

ලෝක ප්‍රකට චින්තකයෙක් හිටිය ඇලෙක්සැන්ඩර් සෙනෙවියෝ ඔහු රුසියානු චින්තකයෙක්. ඔහු ගෙනාව අලුත් සංකල්පයක් අද මානව සංහතිය සුපිරි සමාජයකට ගමන් කරල තියෙනව කියල. ඒ කියන්නෙ එතන රටක්, ජාතියක්, ජම්මයක් නෑ. එතන කිසිම ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ. එතන කිසිම මැතිවරණ ක්‍රමයක් නැහැ. ඡන්ද පැවැත්වීමේ ක්‍රම මුකුත් නැහැ. ඒක හරියටම කියනවා නම් අපේ රටේ ඡන්ද පවත්වනවා. ඇමති මණ්ඩලයක් තියෙනවා. දැන් ඒ තියෙන ආණ්ඩුවේ ව්‍යුහය ඇතුලෙ තව පොඩි ව්‍යුහයක් තියෙනව. දැන් පාර්ලිමේන්තුවේ වැදගත් කමකුත් නැහැ. මෙය සුපිරි සමාජයේ ලක්ෂණයක්. ඒ කියන්නෙ ඒක නිශේධනය කරල එනව වෙන තලයකට. ඒ තලයෙත් තියෙන්නෙ අර ප්‍රතිවිරෝධතාව. ඒ තලය ඉදිරියේදීත් මතු වෙයි.

දැන් ගෝලීය මට්ටමින් ගත්තොත් මේක කලින් සෝවියට් සංගමය, එහෙම නැත්නම් ලෝක සමාජවාදය, මේ පැත්තේ ඇමරිකා එක්සත් ජනපදය, බටහිර යුරෝපීය ධනවාදය. මේ දෙක අතර ලෝක ආධිපත්‍ය සඳහාම අරගලයක් තිබුණා. එතකොට මේක වාදය. අරක ප්‍රවාදය. නමුත් අපිට එහෙම පෙනුනට මෙතන ඒක තේරුම් ගන්න ක්‍රමවේදයක් විදිහට පාවිච්චි කළාට දැන් හුඟ දෙනෙක් කල්පනා කළා ඒ අරගලය සිදු වුණේ කොමියුනිස්ට්වාදය විනාශ කරන්න කියල. ඒක තමයි මිත්‍යාව. අරගලය සිදුවුණේ කොමියුනිස්ට්වාදය විනාශ කරන්න නෙමෙයි. අරගලය සිදු වුණේ බටහිරට අහිමි වුණු බලාධිපත්‍යය යලි තහවුරු කර ගැනීම සඳහා. ඒක දැන් ඒ අය කරගත්තා. දැන් ඒගොල්ලො ගමන් කරනවා සමස්තයක් විදිහට. මානව සංහතියේම සමාජ පරිණාමය ඒගොල්ලො අතට ගත්තා. ඒකත් දැන් සාර්ථකව සිදු වෙනවා. දැන් ඒකට ප්‍රතිවාදයක් විදිහට මතු වෙනවා. චීනය දැන් ආර්ථික බලවතා වේගෙන එනවා. ඇමරිකාව චීනයට හෙට අනිද්දා සෝවියට් දේශයට කළ වැඩේ

කරයි. ඒගොල්ලොමයි කියන්නෙ මේක. දැන් ඔන්න අර හිතන මාදිලියට මේක දානව. දැන් ආසියාවෙත් තියනව.

ආණ්ඩුවේ ජාත්‍යන්තර මතවාදවල මූලික කොටසක් තමයි ලෝකයේ අනාගතය ආසියාව කියන එක. හැබැයි මම හිතන්නෙ ඊට වඩා වෙනස් විදිහට. මොකද මම හිතනව ඔය කියන විදිහට වෙනව නම් හොඳයි කියල. නමුත් අභාග්‍යයකට මෙන් අපට තියෙන දේවල් අනුව එහෙම වීමේ සම්භාවිතාව ඉතාමත්ම අවමයි. ඒ කියන්නෙ බටහිර 91 දී සෝවියට් සංගමය බිඳ හෙලා ඒකෙ ආධිපත්‍යය එයාලගෙ කරගත්ත. ඊට පස්සෙ ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කළා. ඊට පස්සේ ඉරාකයට ආවා. අරාබි වසන්තය එක්ක මෙහාට ඇවිල්ල. දැන් 21 වෙනි ශතවර්ෂයේ මේ ඉදිරි දශක කිහිපය තුළ ප්‍රධානම Target එක තමයි චීනය. 91 දී රුසියාවට කරපු දේ චීනයට කරනව. ඔන්න බලන්න ඉක්මනින් හරි ප්‍රමාද වෙලා හරි ඕක සිද්ධ වෙන්නෙ නැද්ද කියල.

දැන් මෙතන දයලෙක්තික පාවිච්චි වෙන්නෙ අර කලින් ගෙනාපු පාරභෞතික දර්ශනය තුළ නොවෙයි ඇත්ත වශයෙන්ම. ඒක දැන් මාක්ස් වාදය තුළම දයලෙක්තික ක්‍රමය පාරභෞතික කරණයට ලක් කරනවා. ඒක ගේනව සමාන්තර රේල් පීලි දෙකක් හැටියට. ධන, ඍණ වශයෙන්. ඒක ඇත්ත වශයෙන්ම එහෙම වෙන්නෙ නැහැ. මේ මොහොත වන විට මම හිතනවා අර ඇලෙක්සැන්ඩර් සෙනෙවියෝගේ අදහස ගොනු කරගනිමින්, මානව සංහතිය ඇත්ත වශයෙන්ම මොන්ටෙස්ක්‍යුගේ ප්‍රජාතන්ත්‍රවාදී බලය බෙදීම ආදිය බටහිර සමාජ වල ක්‍රියාත්මක වුණේ නැහැ. ඒවා තිබුණේ මතවාද වශයෙන් පමණයි. බටහිර තිබුණේ තෝරා ගැනීමකින් තොර බලයක්. අපි කියනවා ඇමරිකාව ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදයේ තිඹිරිගෙය කියල. කිසිම තිඹිරි ගෙයක් එහි නැහැ. ඒකෙ ඉතාමත්ම අධිපති මූල්‍ය සර්වාධිකාරයක් තියෙන්නෙ. ඒවා පොඩ්ඩක් අත් විඳින්නත් ඕන. අපට දීල තියෙන Identity Card එක ඔස්සේ තමයි අපි පිටතින් සිට බලන්නෙ. ඒකත් එක්ක අපි දයලෙක්තිකය දාල බැලුවොත් ඇත්තටම අපි හිරවෙනවා. මේක මානව පරිණාමය තුළ වළක්වන්න බැහැ. මේක මෙතනදී ඇත්තටම යතාර්ථය ප්‍රතිග්‍රහණය කර ගැනීමේ කලාවක් විදිහට ගන්න ඕන. මේ දයලෙක්තික ක්‍රමය

හරිම සංකීර්ණයි.

අපිට ඕන ජනමාධ්‍ය තේරුම් ගන්න. බටහිර පොත් සීයක් ගත්තොත් මාධ්‍ය සම්බන්ධ සියලු දේවල් ඒ පොත් වල තියෙනව. ඒක තමයි වියුක්ත දැනුම. Abstract Knowledge. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව බටහිර පොත් බැලුවොත් අපිට මිනිසා විසින් මිනිසා පාලනය කරන, පුරවැසි නිදහස තියෙන සමාජයක් පිළිබඳව දැන ගන්න ලැබෙනව. ඒව වියුක්ත අර්ථ කථන. ඒක බලන්න ඕන සංයුක්තව. මාධ්‍ය දේශපාලනයත් එක්ක. මාධ්‍ය සංස්කෘතියත් එක්ක යනාදී වශයෙන් බලන්න ඕනෙ. එවිට මාධ්‍ය මොකක්ද කියල තේරුම් ගන්න පුළුවන්. මේ දෙක තුළින් විෂය මූලික දැනුම නැත්නම් විෂය මූලික යතාර්ථය පැහැදිලි වෙනව. මේ සඳහා තමයි දයලෙක්තිකය පාවිච්චි කරන්න ඕනෙ. සෝවියට් මතවාදය තුළ මේක ඇත්තටම පාරභෞතික කරණයට ලක් වුණා. ඉන් එක්කෙනෙක් තමයි ඒංගල්ස්. එහෙම වුණේ ඒ යුගයේ තිබුණු අවශ්‍යතාත් සමග. මේක තියුණු ලෙස පාවිච්චි කරන්නෙ Logical Realism තුළයි. මානව සමාජයේ කොහොමද මේක වැඩ කරන්නෙ? සමාජයේ අරගල තියෙනව. අතීත ගෝත්‍රික සමාජයේ සිට වර්තමානයේ Masses යුගය දක්වා ඇවිත් තියෙනවා. බටහිර ලෝකයේ කිව්වා සෝවියට් සමාජය ජීවත් වෙන්නෙ පශ්චාත් කොමියුනිස්ට් යුගයක බව. මේකෙ අනික් පැත්ත තමයි පශ්චාත් ප්‍රජාතන්ත්‍රවාදය. ඒකෙ ඒ තලයට ගැලපෙන ආකාරයට යාන්ත්‍රණයක් තියෙනවා. බල Mechanism එකක් තියෙනවා. අද තියෙන්නෙ ඒකයි.

ස්තූතියි.

# ස්තූති කථාව



**ආචාර්ය රංජන් හෙට්ටිආරච්චි,**
**අංශාධිපති,**
**ජනමාධ්‍ය අධ්‍යයන අංශය,**
**ශ්‍රී පාලි මණ්ඩපය,**
**කොළඹ විශ්වවිද්‍යාලය.**

විද්වත් මණ්ඩලයේ සියලුම ආචාර්ය මහාචාර්යවරුන්ගෙන් ද, ඒ වගේම සහභාගී වන සියලුම ශාස්ත්‍රකාමී පිරිසගෙන් ද අවසරයි.

මේ මොහොතේ දී මට පැවරී ඇත්තේ ස්තුති කථාව සිදු කිරීමට. ඊට ප්‍රථමයෙන්, මෙම පොත් දොරට වැඩීම සම්බන්ධයෙන් යමක් කතා කළ හොත්, විශේෂයෙන්ම විවිධ මත, විවිධ අදහස් මේ පොත් සම්බන්ධයෙන් විද්වත් මණ්ඩලයේ ද, ඒ වගේම සම්බන්ධ වූ විද්වත් මණ්ඩලයෙන් ද ප්‍රකාශ වුණා. මේ මත අතර මං හිතන්නේ මෙවැනි උත්සාහයක තියෙන වැදගත්කම පිළිබිඹු වුණා වගේම අපි අනුගමනය කළ යුතු මාවත් පිළිබඳවත් සඳහන් වුණා. විශේෂයෙන්ම මෙම දොරට වැඩුම සාමාන්‍යයෙන් සිදුවන දොරට වැඩුමකට වඩා වෙනස් කියන එක මුල සිටම සඳහන් වූ කරුණක්. පොත පිළිබඳ විචාරයක් කරලා එම පොතේ අන්තර්ගතය පිළිබඳව කථිකාවතක් ඇති වුණා. ඒ සම්බන්ධයෙන් කතා කරන එකට වඩා අපි මේ පොත ඉදිරිපත් වූ ක්ෂේත්‍රයේ වැදගත් වන මාතෘකාවක් ඔස්සේ සාකච්ඡාව මෙහෙයවලා ඒ පිළිබඳව දැනුවත් වීම මෙම දොරට වැඩීමේ අවස්ථාවේ දී සිදුවීම හොඳයි කියන එක මං හිතන්නේ. අපි දන්නවා ඕනෑම දෙයක් නිර්මාණාත්මකව කරන කොට එම නිර්මාණාත්මකව කරන දේ ඇතුලේ තියෙන්නේ තමන් නිර්මාණය කරන දෙයට කෙලින්ම ළඟා නොවී නිර්මාණශීලීව එම ඉලක්කය

වෙත ළඟා වීම. අපි ඇපල් ගෙඩියක් අත දික්කරලා ගන්නවාට වඩා අපි ඇපල් ගෙඩිය වෙන විදිහට ගැනීම තමා නිර්මාණාත්මක අදහසක් කියල කියන්නේ. මම හිතන්නේ අද මෙම උත්සව අවස්ථාවෙත් මං දකින්නේ එවැනි දෙයක්.

අපි කතා කළේ ජනමාධ්‍ය ඇතුළේ තියෙන තිබුණු දෙයක් ගැන. අපේ ජීවිතේම අංගයක් වන මාධ්‍ය ගැන කතා කළේ. මේ පොත් 4 න්ම එළියට එන්නෙත් ඒකම තමා. මම හිතන්නේ අපි මේක සංඥාර්ථවේදය ඇතුළේ කතා කළාට එහෙම නැත්නම් සංඥාර්ථවේදී ප්‍රවේශයක් ඔස්සේ ජනමාධ්‍ය මෙහිදී කතා කළාට ඔබ සැමටම මෙහි අන්තර්ගතය පැහැදිලි වෙනවා. අපි කතා කරන්නේ සමස්ත මාධ්‍ය ගැන. ඒකෙ තියෙන්නේ සාකල්‍ය ප්‍රවේශයක්. මම හිතන්නේ මෙහි දී විවිධ Angel තියෙනවා. මාධ්‍ය ගැන කතා කරන කොට විවිධ මාවත් තියෙනවා.

අපි පර්යේෂණ ගැන කතා කරන කොට මේ ග්‍රන්ථ 4 ම එළියට එන්නේ අපේ පර්යේෂණ අංශයෙන්. ඒ කියන්නේ ශ්‍රී පාලි මණ්ඩපයේ පර්යේෂණ අංශය ගොඩනැගෙන්නේ ඉතාමත් මෑත කාලීනව. දැනටමත් මං හිතන්නේ ඒක අත දරුවෙක් කියලා. ශ්‍රී පාලි මණ්ඩපයේ අත දරුවෙක් කතා කරන්නේ කියලා අපි සතුටු වෙන්න ඕන. ඒ ළමයා බිමට හෙළලා දාන එක වැරදියි කියන එක මම කියන්න ඕනේ. කෙසේ හෝ මම යමක් කිව යුතුයි. අපි නිර්ණායක මත කතා කරන කොට අපි හැම දෙයක්ම නිර්ණායක මත ද, තවත් කෙනෙක් දාපු නිර්ණායක මත ද අපි තීරණය කරන්න ඕනේ කියල හිතන්න ඕනේ. එහෙම නම් බුදුහාමුදුරුවන්ටත් බුදු වෙන්න පුළුවන් කමක් නෑ. මොකද එතුමා අනිත් අය දිහා බලාගෙන කොහොමද කරන්නේ කියලා හොයන්න උත්සාහ කළේ නෑ. තමන්ගේම උත්සාහයෙන් කළ නිසා තමා එතුමා අලුත් දැනුමක් ලොවට බිහි කළේ.

ඒ නිසා අපි වර්ග කරන පර්යේෂණ දෙකක් තියෙනවා. එකක් තියෙනව Theory වලින් ගොඩනගන පර්යේෂණ. අනිත් එක Theory වලින් ගොඩනගන්නේ නැති පර්යේෂණ. දැනුම සාපේක්ෂ වශයෙන් යොදාගෙන අපි නිෂ්පාදනය කරන්නෙ පර්යේෂණ. එතකොට අපි නිර්මාණය කරන පර්යේෂණ තුළින් ගොඩනගන

න්‍යායක් හදනකොට අපි අලුත් දෙයක් එතන නිර්මාණය කරන්නේ. මං හිතන්නේ එහෙම සුභවාදී දෘෂ්ටි කොණයකින් මේ වෑයම දෙස බලන්න අපිට පුළුවන් නම් මේ පර්යේෂණ ඒකකය අපිට ගොඩක් දුර අරගෙන යන්න හැකියාවක් තියෙනවා.

මං හිතන්නේ අද අපි අතරින් මේ එළි දක්වෙන ග්‍රන්ථ 4 ඉතාමත්ම කාලයක් තිස්සේ ගතවෙච්ච පර්යේෂණ. ඒක මං හිතන්නේ අවුරුදු දෙක තුනක ඉඳලා කරන වෑයමක්. අපිට ලිපි හම්බ වෙනවා. ලිපි වල වැරදි තියෙනවා. ආයෙමත් යවනවා. මේ විදිහට මීට අවුරුදු දෙකක සිට මහත් වෑයමක ප්‍රතිඵලයක් වශයෙන් තමා මේ සංඥාර්ථවේදී ග්‍රන්ථ එළි දකින්නේ. මමත් අවුරුදු එකහමාරක විතර ඉඳලා මේකට දාඟලුවා. හැබැයි මට මේක ඉවර කරගන්න බැරි වුණා. ශ්‍රී රංජන් සර් ආවට පස්සේ මහත් කැපවීමක් කළා මේක එළියට ගන්න. ඒ කැපවීම මේ විදිහට එළි දකිනකොට අපිට ලැබෙන්න ඕන සතුටක්. අපි අවුරුදු ගාණක් කරන්න උත්සාහ කරන දෙයක් මේ විදිහට යතාර්ථයක් කරපු එක මං හිතන්නේ අපි අගය කරන්න ඕනෙ. අපට අවශ්‍ය ඒ ඇගයීම. අපි දන්නවා හැම තිස්සේම නිතරම අපි යම්කිසි දෙයක් දිහා බලන්නේ දෘෂ්ටි කෝණ ද්වන්දයක් ඇතුලේ. සුදු දකින්නේ අපි කළු තියෙනවා නම්. අඳුර දකින්නේ ආලෝකය තියෙනවා නම්. හොඳ දකින්නේ අපි නරක තියෙනවා නම්. ඒක තමා ලෝක ස්වභාවය. ඒක තමා අපි අර්ථ උපදවන, අර්ථ ජනනය කරන Bipolar එක.

Journal එකක් ඇතුලේ අපි අන්තර්ගතයන් යම්කිසි විදිහකින් ආරක්ෂා කළ යුතු නම් ඒක ආරක්ෂා කළ යුතුයි. ඒක ලෝක ප්‍රජාවට අනුව International වෙනවා. ඒක වෙනම කතන්දරයක්. හැබැයි Journal එකේ ගුණාංග ඇතුලේ International ද, Local ද කියන එක ගැන විභේදන ඇති කර ගත යුතු නැහැ. අපි මේ ග්‍රන්ථ 4 ඇතුලේ මේ ලිපි ලියන කර්තෘවරුන් දිහා බැලුවම ජාත්‍යන්තර, ජාතික තලයේ දැනුමක් ලබා ගන්න අය. එතකොට මේ දැනුම ලබා ගත්ත අය ඇතුලේ සමහර විට ශ්‍රී ලාංකික වපසරිය ඇතුලේ දියුණු නොවෙච්ච සාම්ප්‍රදායික රචනා ශෛලීන් ඔස්සේ ලියන ලද ලිපි තියෙන්න පුළුවන්. හැබැයි එහෙම ලියවුණාට ඒ ලිපි ඇතුලේ අන්තර්ගතයේ තියෙන්නේ ගුණාත්මක බව. මම මේ ලිපි

ගොඩක් කියෙව්වා. මං හිතන්නෙ සංඥාර්ථවේදී ප්‍රවේශයක් ඔස්සේ යම්කිසි දෙයක් බලන්නෙ Linguistically. "සොසියර්", චාර්ල්ස් මොරිස්" සංඥාර්ථවේදය ගැන කතා කරනවා. එතකොට ඔවුන්ගේ මෙම දැක්ම කොයි විදිහට ද, අනෙකුත් අය කොයි විදිහට ද මේ ලිපි ලියල තියෙන්නෙ සහ ඒවා ප්‍රතිනිර්මාණය කරලා තියෙන්නේ කියන එක මේ ගැන කියවනකොටම අපිට දැනෙනවා. ඒ නිසා එහි අන්තර්ගතය යම් කිසි විදිහකින් අඩු ද වැඩි ද කියන එක, නැත්නම් පෝෂණය වෙලා අඩු ද නැද්ද කියන එක නෙමෙයි. ඒකෙන් දැනුමක් ළඟා වෙනවා. ඒ නිසා මේ එළි දක්වන ලද කෘති වල, එළි දක්වන ලද දැනුම ඇතුලේ මේ විෂය පෝෂණය වීම සඳහා නූතන ජනමාධ්‍ය, නූතන සංහතික මාධ්‍ය සංවර්ධනය සඳහා අති දැවැන්ත වූ දැනුම සම්භාරයක් මේ පොත් වලින් එළියට එනවා. ඒත් එක්කම විශාල කතිකාවතක් ඒ ඔස්සේ ගෙනියන්න රාමුවක් මේ තුළින් ගොඩ නැගෙනවා.

හැම දෙනාගේම කතා වලදී මම දැක්ක දෙයක් තමා සංස්කෘතිකවාදය එහෙම නැත්නම් ව්‍යුහවාදය එහෙම නැත්නම් Frame එකක් ඇතුලේ මේ හැම දෙයක්ම සිද්ධ වෙනවා කියන කථාව. Mass කියන සංකල්පය ඔස්සේ Mass කියන Construction එක ඇතුලේ ලෝකය ගොඩනගන ආකාරය අද මේ කතිකාව ඇතුලේ ගොඩ නැගුණා. එතකොට මේවායෙන් වියුක්ත වෙලා අපිට අද කතා කරන්න බෑ. ඒ නූතන ජනමාධ්‍ය, නූතන සංහතික මාධ්‍ය, නූතන සන්නිවේදනය, කොයි විදිහටද දුවන්නේ, මේ ගොඩනැගෙන යතාර්ථය ලෝකය පාලනය කරන, ලෝකය මෙහෙයවන, ලෝකයේ ප්‍රතිපත්ති සැකසුමට උදව් වන මේ ප්‍රධාන නියාමක බලවේගය ගැන මං හිතන්නේ යතාර්ථවත් ආකාරයට, තථ්‍ය වූ ස්වරූපයකින් මේ විද්වත් කතිකාව තුළ දැනුම් සම්භාරයක්, අදහස් ගණනාවක්, මහා ඥාන කෝෂයක් අද ඉදිරිපත් වුණා. ඒ කියන්නේ අපි හැමෝටම ඒක ගැන සතුටු විය හැකියි. ඒ විශේෂ අවස්ථාවට මං හිතන්නේ ඒ පූර්විකාව කරන්න මට අවසර නැහැ.

විශේෂයෙන්ම මේ අවස්ථාවට පැමිණි ඔබට ස්තුති කරන්න මට ලැබිල තියෙන්නෙ. මේ දොරට වැඩුම, මම පොත් හතර ගැන මොනවත්ම කියන්නේ නැහැ. එහෙම නම් ඔබට සම්පූර්ණ නිදහස

තියෙවා විචාරශීලීව ඕනෑම දෙයක් මාධ්‍යයෙන් හෝ ඕනම විදිහකින් ඉදිරිපත් කරන්න. ඒ ගැන කිසිම වාරණයක් නැහැ. ඒ නිසා මේ උත්සව අවස්ථාවට, දොරට වැඩුම අවස්ථාවට පැමිණි ඔබට ස්තුති කිරීම ශ්‍රී පාලි මණ්ඩපයේ ජනමාධ්‍ය අධ්‍යයනාංශයේ පර්යේෂණ ඒකකය කළ යුතු වෙනවා. විශේෂයෙන්ම අද මේ අවස්ථාවට පැමිණියේ ඉතාමත් දැනුම් ඇති චරිත කිහිපයක්. ඉතාමත් අවිවේකී උගතුන් පිරිසක්.

කැලණි විශ්වවිද්‍යාලය ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ අංශාධිපති මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස මැතිතුමා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්යවරු දෙපලක් වන ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර මැතිතුමා සහ ටෙනිසන් පෙරේරා මැතිතුමා ඉතාමත්ම අවිවේකීව සිටියදී තමයි මේ අවස්ථාවට සහභාගී වුණේ. ඒ වගේම අපේ කවදත් හිතවතා ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන. එතුමන් විශාල කැප වීමක් සිදු කළා. ඔබ වෙනුවෙන් මේ කතිකාවතට සහභාගී වෙන්නේ ඔබව දැනුවත් කරන්න. ඔබට දැනුමක් ලබා දෙන්න. ඔවුන්ට ස්තුතිවන්ත වෙනවා. ඒ නිසා ඔබගේ එම දැවැන්ත බුද්ධියෙන් යමක් මේ ශ්‍රී පාලි මණ්ඩපයේ සිසු පරපුරට ලබා දෙන්නට ඔබගේ වටිනා කාලය කැප කර ගත් වෙහෙස මහන්සියට අපි ස්තුතිවන්ත වෙනවා. මං හිතන්නේ ආචාර්ය ටියුඩර් වීරසිංහයන්ගේ දැනුම අපට විශාල ශක්තියක්. මං හිතන්නේ අපි හොඳටම දන්නවා ඔහුගේ මග පෙන්වීමෙන් තමා මේ ශ්‍රී පාලි මණ්ඩපය පෝෂණය වෙන්නේ. ඒ නිසා අපි එතුමාටත් ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාවට සහභාගී වීම සම්බන්ධයෙන්.

මෙහි දී දායකත්වය දුන් ඔබ හැමෝගේම කැපවීම ගැන සඳහන් කරන්න ඕනේ. මාධ්‍ය ආයතන අපට විශේෂයෙන්ම විශේෂ අනුග්‍රහයක් දක්වල තියෙනවා. ඒ නිසා මාධ්‍ය ආයතන වලටත් අපි විශේෂ ස්තුතියක් කරන්න ඕනේ. ඒ වගේම මාධ්‍ය ආයතන වල වැඩ කරන මේ ස්ථාන වලට පැමිණි අයටත්, මාධ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් මේ ස්ථානය ආවරණය කළ අයටත්, මාධ්‍ය ආයතන වලින් විශේෂ අනුග්‍රහයක් ලබා දුන්න අයටත් අපි ස්තුතිවන්ත වෙනවා. ශ්‍රී පාලි මණ්ඩපය මේ විදිහට පිටුවක් පෙරලීමට ශ්‍රී රංජන්

සර් කරපු කැපවීම විශේෂයි. ඔහුට විශේෂ ස්තුතියක් පුද කළ යුතුයි.

ඒත් එක්කම ශ්‍රී රංජන් සර් එක්ක වැඩකරන ශිෂ්‍ය පිරිසක් මම දකිනවා. ඒ ශිෂ්‍ය පිරිසට ද ස්තුතිවන්ත වෙනවා. ඔවුන් කාගේත් කැපවීම තමා මේ ග්‍රන්ථ හතර ඇතුලෙ තියෙන්නේ. පිටකවරේ ලස්සනට පෙනෙන්නේ. මෙම වැයම දරපු ඒ පිරිසගේ හදවත් ලස්සනයි. ඒ වගේම අපේ ප්‍රාසාංගික කලා අධ්‍යයනාංශයේ අංශාධිපති භාගේශ්‍රී ෆොන්සේකා මැතිතුමනි ඔබටත් අපි ස්තුතිවන්ත වෙනවා.

ඉතිං මේ සියලු දෙනාටමත්, ශ්‍රී පාලි ජනමාධ්‍ය අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලය, තාවකාලික ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය ප්‍රජාව, ශබ්ද පරිපාලන සහ වේදිකා පරිපාලන කටයුතු සිදු කළ සියලුම දෙනාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ස්තුතියි.

# මාධ්‍ය පර්යේෂණ ඒකකය මඟින් ප්‍රකාශිත කෘති දොරට වැඩීම සහ විද්වත් කතිකාව




**ප්‍රකාශක**
මාධ්‍ය පර්යේෂණ අංශය,
ශ්‍රී පාලි මණ්ඩපය,
කොළඹ විශ්ව විද්‍යාලය,
හොරණ.

CENTER FOR MEDIA RESEARCH
SRI PALEE CAMPUS
UNIVERSITY OF COLOMBO